ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

அனர்த்த முகாமைத்துவ அமைச்சு

**Ministry of Disaster Management**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# Annual Performance Report

# 2013

පටුන


| | | |
|---|---|---|
| 1. | **ආපදා කළමනාකරණ අමාත්‍යාංශය** | **පිටුව** |
| 1.1 | හැඳින්වීම | 03 |
| 1.2 | දැක්ම | 03 |
| 1.3 | මෙහෙවර | 03 |
| 1.4 | අභිමතාර්ථ | 04 |
| 1.5 | කාර්යයන් | 05 |
| 1.6 | ක්‍රියාත්මක ව්‍යුහය | 05 |
| 1.7 | පොදු කරුණු | 06 |
| 1.8 | අමාත්‍යාංශ ගොඩනැගිල්ල තුල ස්ථාපිත කර ඇති කාර්යාල | 06 |
| 1.9 | අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය | 07 |
| 1.10 | ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව | 08 |
| 02. | පාලන කටයුතු | 08 - 17 |
| 03. | සැලසුම් හා සංවර්ධන කටයුතු | 18 - 20 |
| 04. | ගිණුම් කටයුතු | 21 - 22 |
| 05. | ප්‍රසම්පාදන කටයුතු | 23 |
| 06. | අභ්‍යන්තර විගණන කටයුතු | **24** |
| 07. | ජාතික ආපදා සහන සේවා කටයුතු | **25 -39** |

## 1.1 හැඳින්වීම

**ආපදා කළමනාකරණ අමාත්‍යාංශය**

ආපදා කළමනාකරණ විෂය වඩාත් වැදගත් වීමට හේතුවූ ප්‍රධාන සාධකය වූයේ ශ්‍රී ලාංකීය ජනතාවට මින් පෙර අත්දකින්නට නොලැබුණු ආකාරයේ සිදුවීමක් වූ වර්ෂ 2004 දෙසැම්බර් මස 26 වන දින බලපෑ සුනාමි ව්‍යසනයෙන් තිස්පන්දහසකට (35000) අධික ජීවිත සංඛ්‍යාවක් අහිමි වීමය. එම ව්‍යසනයෙන් ලක්ෂ 5කට අධික ජනතාව අභ්‍යන්තර අවතැන් වූවන් බවට පත්විය.

මෙම ජීවිත හානි, ආර්ථික පසුබෑම සහ ඉන් සමාජයට වූ බලපෑම සම්බන්ධයෙන් සුභසාධන කටයුත්තක් සේ පැවති ආපදා කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් හා නීතිමය ව්‍යුහයක අවශ්‍යතාවය ඉස්මතු විය. ඒ අනුව මෙවැනි ව්‍යසනයන්ට සාර්ථකව මුහුණදීමට අවශ්‍ය ආයතනික හා නීතිමය ව්‍යුහය නිර්ණය කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් ස්ථාපිත කරන ලදි. එම තේරීම් කාරක සභාවේ නිර්දේශයන්ට අනුව 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලදි.

ඒ අනුව 2005 අංක 13 දරණ ව්‍යසන කළමනාකරණ පනතින් ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් ස්ථාපිත කරන ලදි. එම ආයතන තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා වර්ෂ 2006 ක් වූ පෙබරවාරි මස 20 වෙනි දින නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ආපදා කළමනාකරණ හා මානව හිමිකම් පිළිබඳ කැබිනට් අමාත්‍යාංශය ස්ථාපිත කරන ලද අතර, 2010 අප්‍රේල් මස 30 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ලෙස නම්කොට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය අමාත්‍යාංශය යටතට ගෙනෙන ලදි. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා 2010 නොවැම්බර් මස 19වෙනි දින දෙවන ධූර කාලයේ දිවුරුම් දීමත් සමග කරන ලද අමාත්‍ය මණ්ඩල සංශෝධනයේ දී ආපදා කළමනාකරණ අමාත්‍ය ලෙස ගරු මහින්ද අමරවීර මැතිතුමා සහ නියෝජ්‍ය අමාත්‍ය ලෙස ගරු ඩුලිප් විජේසේකර මැතිතුමා 2010 නොවැම්බර් 22 වෙනි දින වැඩ භාරගන්නා ලදි. එස්.එම්.මොහොමඩ් මහත්මිය අමාත්‍යාංශයේ ලේකම් ලෙස නැවතත් පත්කරන ලද අතර 2010 නොවැම්බර් මස 23 වෙනි දින වැඩ භාර ගත්තාය.

## 1.2 දැක්ම

“සුරක්ෂිත ශ්‍රී ලංකාවක් ”

## 1.3 මෙහෙවර

ශ්‍රී ලංකාව තුළ “ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන ආපදා වලින් ඇති වන්නා වූ අහිතකර බලපෑම් ඵලදායි ලෙස වැළැක්වීම සහ අවම කිරීම තුළින් සමෘද්ධිමත් සහ අභිමානවත් ජන ජීවිතයක් තහවුරු කිරීම ”.

## 1.4 අභිමතාර්ථ

අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් ක්‍රියාත්මක කරනු පිණිස අමාත්‍යාංශයේ කටයුතු පහත සඳහන් පරිදි ප්‍රධාන ක්ෂේත්‍ර තුනකට බෙදා ඇත

- ❖ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන ආපදා වලින් ජන ජීවිත, දේපළ සහ සේවා සුරක්ෂිත කිරීම. (වැළැක්වීම, අවම කිරීම, පෙර සූදානම, පර්යේෂණ සහ සංවර්ධන)
- ❖ ප්‍රත්‍යස්ථ සමාජයක් උදෙසා ප්‍රජා සුරක්ෂිතභාවය තහවුරු කිරීම. (පූර්ව අනතුරු ඇඟවීම්, හදිසි මෙහෙයුම්, මුදවා ගැනීම හා සහන සේවා)
- ❖ පශ්චාත් ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම. (යථා තත්ත්වයට පත් කිරීම, පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය)

## 1.5 කාර්යයන්

මෙම අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා 2010 නොවැම්බර් 22 නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අමාත්‍යාංශය වෙත පහත සඳහන් කාර්යයන් පවරා ඇත.

- ➢ ස්වාභාවික විපත් හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන විපත්වල දී සහන සැලසීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා කළමනාකරණය.
- ➢ ව්‍යසන අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම හා යථාත්වීකරණය පිළිබඳ ප්‍රතිපත්ති, වැඩ සටහන් හා ව්‍යාපෘති සම්පාදනය
- ➢ අදාල අරමුණ සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරින් සමග එකගතාවයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම
- ➢ ජාතික ප්‍රතිපත්තිය මත පදනම් වූ ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම හා හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස් කිරීම
- ➢ ව්‍යසන අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම සහ යථාත්වීකරණය පිළිබද විදේශීය ආධාර ව්‍යාපෘති ආරම්භ කිරීම හා සම්බන්ධීකරණය
- ➢ ඉහත කාර්යයන් නිසි වේලාවට ක්‍රියාත්මක වීම සහතික කර ගැනීම පිණිස අමාත්‍යාංශ හා රාජ්‍ය සංවිධාන සමග සම්බන්ධීකරණය
- ➢ ස්වාභාවික වියසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන ව්‍යසන පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම
- ➢ ගංවතුර , නියගය , නායයෑම්, වසංගත රෝග සහ වෙනත් විශේෂ හේතුන් නිසා සිදුවන ආපදාවන්හි දී සහන සැලසීම
- ➢ ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන ව්‍යසන වලදී ගලවා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම

- පෙර අනතුරු ඇඟවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම
- නිවාස හා ගොඩනැගිලි ඉදි කිරීම් තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු
- කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ කටයුතු
- අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පවතින ආයතනවල අනෙකුත් සියළුම විෂයයන් හා අධීක්ෂණ කටයුතු

### 1.6 ක්‍රියාත්මක ව්‍යුහය

ඉහත අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන් සහ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා අමාත්‍යාංශය යටතේ පහත සඳහන් ආයතන ක්‍රියාත්මක වේ.

- ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය අමාත්‍යාංශයේම අංශයක් ලෙස ක්‍රියාත්මක වුවද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යන ආයතන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ වෙනම ආයතන වශයෙන් ක්‍රියාත්මක වේ.

අමාත්‍යාංශයේ ඍජු අධීක්ෂණය, මාර්ගෝපදේශකත්වය හා පහසුකම් මත ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් පහත සඳහන් කාර්යයන් 2013 වසර පුරා ක්‍රියාත්මක කරන ලදි.

- ✓ විපතට පත් ජනතාව සඳහා අවශ්‍ය සහන සැලසීම
- ✓ ආපදා වලින් පිඩාවට පත්වන ජනතාව වෙනුවෙන් ව්‍යාපෘති හඳුනා ගැනිම, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම (වැසි ජල ටැංකි ඉදි කිරීම ආදිය)
- ✓ ස්වාභාවික මෙන්ම මිනිසා විසින් නිර්මිත ආපදාවලින් පීඩාවට පත් ජනතාවගේ ජීවනෝපායන් සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් කරනු පිණිස පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ✓ නියඟයෙන් වන පීඩා අවම කිරීම සඳහා ජල සැපයුම් හා නියං සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ✓ ආපදා තත්ත්වයන් පිළිබඳ දත්ත රැස් කිරීම සහ තොරතුරු ප්‍රචාරය කිරීම.
- ✓ ආපදා වාතාවරණයන්ට මුහුණ දෙන ආකාරය සහ සහන යාන්ත්‍රණ පිළිබඳව රාජ්‍ය නිලධාරීන් සහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම.
- ✓ හදිසි ආපදා තත්ත්වයකදී සහන මෙහෙයුම සම්බන්ධීකරණය කිරීම
- ✓ කාර්ය-සම්පාදන සේවාවන් සැපයීම

## 1.7 පොදු කරුණු:


කාලගුණික හා දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම මත ශ්‍රී ලංකාව තුළ ආපදාවන්ට ගොදුරුවන හා පීඩාවට පත්වන ප්‍රමාණය ඉහල යමින් පවතී. ගංවතුර, නායයෑම්,නියගය හා තද සුළං ශ්‍රී ලංකාව තුළ නිරන්තරයෙන් සිදුවන ආපදා අතර ප්‍රධාන වේ.

එසේ නිරන්තරයෙන් සිදුවන ආපදා තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දීමට හා ඒවායේ බලපෑම අවම කරගැනීම සඳහා ජනතාව හා ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ නිරත නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම් සිදුකල යුතු වන අතර, මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනය මඟින් ද එය අවධාරණය කර ඇත. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සියළු පහසුකම් වලින් සමන්විත ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු අමාත්‍යාංශය මඟින් සිදුකරමින් පවතින අතර, ඊට අදාල ව්‍යාපෘති සංකල්ප පත්‍රයක් දැනටමත් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇත.

## 1.8 අමාත්‍යාංශ ගොඩනැගිල්ල තුල ස්ථාපිත කර ඇති කාර්යාල

- ගරු අමාත්‍යතුමාගේ කාර්යාලය
- ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යාලය
- ලේකම්තුමියගේ කාර්යාලය
- ව්‍යසන කළමනාකරණ ජාතික සභාවේ ලේකම් කාර්යාලය
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
- ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය

## 1.9 ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - සංවිධාන ව්‍යුහය



### 1.10 ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව

2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත යටතේ ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව ස්ථාපිත කරන ලදි. මෙහි සභාපතිවරයා වශයෙන් අතිගරු ජනාධිපතිතුමන් මුලසුන හොබවන අතර, ගරු අග්‍රාමාත්‍යතුමන් උප සභාපති වේ. එමෙන්ම විපක්ෂ නායකතුමන් සහ පනතේ සඳහන් අනෙකුත් විෂයභාර අමාත්‍යවරුන් සහ පළාත් සභා ප්‍රධාන ඇමතිවරුන්ගෙන් මෙම සභාව සමන්විත වේ. ව්‍යසන කළමනාකරණයට අදාල ජාතික ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ජාතික සැලසුම් සම්පාදනය හා බලතල ක්‍රියාවට නැංවීම, අධීක්ෂණය හා රට තුළ සිදුවන කුමන හෝ ආපදා තත්ත්වයක දී තීරණ ගැනීම මෙම ජාතික සභාවේ ප්‍රධාන කාර්යයන් වේ.

අතිගරු ජනාධිපතිතුමන්ගේ සභාපතිත්වයෙන් රැස්වීම් වාර 01 ක් මෙම වසර තුළ පවත්වා ඇත. එම රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සඳහා අනුමැතිය ලැබී ඇත.

01. 2013 – 2017 වර්ෂ සඳහා සකස් කරන ලද ශ්‍රී ලංකා ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීම.
02. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2011 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව හා ගිණුම් සඳහා අනුමැතිය ලබාදීම.
03. 2013 වර්ෂය සඳහා වූ ආපදා කළමනාකරණ ක්‍රියාකාරි සැලැස්ම සඳහා අනුමැතිය ලබාදීම
04. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සංයුක්ත සැලැස්ම 2013 – 2017 සඳහා අනුමැතිය ලබාදීම
05. ජලාශවල මඟී ප්‍රවාහනයේ දී ආරක්ෂිත කබා පැලදීම අනිවාර්ය කිරීමේ නීති රෙගුලාසි අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කර සකස් කිරීමට තීරණය කිරීම.
06. 2013 වසරට පර්යේෂණ සඳහා වෙන්ව ඇති ප්‍රතිපාදන වලින් මාතලේ දිස්ත්‍රික්කයේ භූමිය ගිලා බැසීම සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීමට අනුමැතිය දීම.
07. ආපදා අවස්ථාවක දී ස්වේච්ඡා භටයන් වශයෙන් පාසල් ළමුන් දායක කර ගැනීමේ වැඩපිළිවෙලක් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව සකස් කිරීම සඳහා අනුමැතිය දීම.
08. ආපදා අවස්ථාවක දී ක්‍රියා කිරීම සඳහා යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශයේ හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන සහයෝගයෙන් සකස් කරන ලද වැඩපිළිවෙල සඳහා අනුමැතිය ලබාදීම.

## 02. පාලන කටයුතු

✓ **බඳවා ගැනීමේ පටිපාටිය**

2013 වසර තුළ කාර්මික නිලධාරි තනතුර සඳහා සකසන ලද බඳවා ගැනීම් පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබූ අතර, ඒ සඳහා අනුමැතිය ලැබී ඇත.

✓ **කාර්ය මණ්ඩලය**

| අනු අංකය | තනතුරු නාමය | අනුමත කාර්යය මණඩලය | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| 1 | ලේකම් | 1 | 1 | 0 | |
| 2 | අතිරේක ලේකම් (සංවර්ධන හා සහන සේවා) | 1 | 1 | 0 | |
| 3 | අතිරේක ලේකම් (මුදල් හා පාලන) | 1 | 0 | 1 | |
| 4 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 1 | 1 | 0 | |
| 5 | ප්‍රධාන ගණකාධිකාරි | 1 | 1 | 0 | |
| 6 | අධ්‍යක්ෂ (ආපදා සහන සේවා) | 1 | 1 | 0 | |
| 7 | අධ්‍යක්ෂ (කළමනාකරණ) | 1 | 0 | 1 | |
| 8 | අධ්‍යක්ෂ (සැලසුම්) | 1 | 1 | 0 | |
| 9 | අධ්‍යක්ෂ (ජාතික ව්‍යසන කළමනාකරණ සභාව) | 1 | 0 | 1 | |
| 10 | සහකාර ලේකම් | 2 | 2 | 0 | |
| 11 | ගණකාධිකාරි | 1 | 1 | 0 | |
| 12 | ගණකාධිකාරි (අභ්‍යන්තර විගණන) | 1 | 0 | 1 | |
| 13 | නි.අධ්‍යක්ෂ/ස.අධ්‍යක්ෂ (කළමනාකරණ) | 1 | 1 | 0 | |
| 14 | නි.අධ්‍යක්ෂ/ස.අධ්‍යක්ෂ (සැලසුම්) | 1 | 1 | 0 | |
| 15 | නි.අධ්‍යක්ෂ/ස.අධ්‍යක්ෂ (ආපදා සහන සේවා) | 3 | 1 | 2 | |
| 16 | නීති නිලධාරි | 1 | 1 | 0 | |
| 17 | පරිපාලන නිලධාරි | 1 | 1 | 0 | |
| 18 | ලේකම් ගේ සම්බන්ධීකරණ ලේකම් | 1 | 1 | 0 | |
| 19 | භාෂා පරිවර්තක | 2 | 1 | 1 | |
| 20 | සංවර්ධන නිලධාරි | 1 | 1 | 0 | |
| 21 | සංවර්ධන සහකාර | 8 | 8 | 0 | |
| 22 | සංවර්ධන නිලධාරි (111 ශ්‍රේණිය) | 30 | 24** | 0 | 6*** |
| 23 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 20 | 12 | 8 | |
| 24 | දත්ත සටහන් ක්‍රියාකරු | 1* | 0 | 1 | |
| 25 | කාර්මික නිලධාරි | 1 | 0 | 1 | |
| 26 | නිශ්චල ඡායාරූප ශිල්පී | 1 | 0 | 1 | |
| 27 | කැමරා ක්‍රියාකරු (තාවකාලික) | 1 | 0 | 1 | |
| 28 | කැමරා ක්‍රියාකරු සහායක | 1 | 1 | 0 | |
| 29 | රියදුරු | 15 | 12 | 3 | |
| 30 | කාර්යාල කාර්ය සහායක | 15 | 14 | 1 | |
| | **එකතුව** | 117 | 88 | 26 | |

* මෙම අමාත්‍යාංශයට අනුයුක්තව සිටි දත්ත සටහන් ක්‍රියාකරු , වර්තමානයේ දී ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස රාජකාරි ඉටු කරනු ලබයි.

** සංවර්ධන නිලධාරි සේවයේ ස්ථිර පත්වීම්

*** පුහුණු

අමාත්‍යාංශය ආරම්භ කිරීමේ දී අනුමත කාර්ය මණ්ඩලය හැත්තෑහතක් (77) වූ අතර, එය ක්‍රමයෙන් වර්ධනය වෙමින් 2013 වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලය එකසිය දහහත (117) දක්වා වැඩිකර ගැනීමට හැකි වී තිබේ. අමාත්‍යාංශයේ කාර්යභාරය දිනෙන් දින පුළුල් වීමත් , අමාත්‍යාංශය තුල කළමනාකරණ අංශය හා සැලසුම් හා සංවර්ධන අංශය වශයෙන් අළුතින් අංශ ඇති කිරීමත් සමගම අනුමත කාර්ය මණ්ඩලයේ ද වැඩිවීමක් සිදුවී ඇත. ඒ අනුව, අමාත්‍යාංශය මඟින් සකස් කලයුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව , සංයුක්ත සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම, ක්‍රියාකාරි සැලැස්ම, මධ්‍යකාලීන ආයෝජන සැලැස්ම සකස්කර ඉදිරිපත් කිරීමට හැකියාව ලැබී ඇත.

✓ **ස්ථාන මාරුවීම් / විශ්‍රාම ගැන්වීම්**

2013 වර්ෂයේ ජනවාරි මස සිට එම වර්ෂයේ දෙසැම්බර් මස දක්වා අමාත්‍යාංශයේ සේවක මහත්ම මහත්මීන් දහහත්දෙනෙකු (17) වෙනත් සේවා ස්ථාන සඳහා මාරුවීම් ලැබ ඇති අතර, අමාත්‍යාංශය වෙත ස්ථානමාරු ලැබ පැමිණි සේවක මහත්ම මහත්මීන්ගේ ගණන දහතුන්දෙනෙකි (13). 2013 වසරේ විශ්‍රාම යන ලද නිලධාරීන් ගණන එකකි. එය වෛද්‍ය හේතුන් මත සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමකි.

✓ **පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීම් පැවැත්වීම**

2013 වර්ෂය තුළ පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීම් වාර හතක් (07) පවත්වා ඇත. එහිදී යෝජනා දහහතක් (17 ) ක් ඉදිරිපත් වී ඇති අතර, ඉදිරිපත් වූ සියළු ගැටළු සඳහා පිළිතුරු යවා ඇත. 2011 වසරේ සිට 2013 වසර දක්වා වූ පාර්ලිමේන්තු උපදේශක කාරකසභාවන්හි සාකච්ඡා වූ කරුණු පදනම් කරගෙන තෝරාගත් පහත සඳහන් සුවිශේෂී ගැටළු සම්බන්ධයෙන් ඉදිරි පියවර ගනිමින් ඒ සඳහා අදාල කටයුතු ආරම්භ කිරීමට හැකියාව ලැබී ඇත.

01. ආපදා වලින් හානියට පත්වන නිවාස සඳහා සහන ලබාදීම සම්බන්ධයෙන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා තිබූ බලය ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත පවරා අයවැය චක්‍රලේඛ අංක 152 (1) මඟින් ඒ සඳහා අමාත්‍යාංශය වෙත උපදෙස් හා බලය ලබා දිම. මේ නිසා 2012 වසරේ ඇතිවූ ආපදා හේතුවෙන් නිවාස අහිමිවූවන් සඳහා නිවාස සහනාධාර ලබාදිමට 2013 වසරේ දී මහා භාණ්ඩාගාරයෙන් රු.මි.425 ක මූල්‍ය ප්‍රතිපාදන ලබැගැනීමට හැකි විය. මාස 05 ක් වැනි කෙටි කලක් තුළ රුපියල් මිලියන 344 ක මුදලක් වැයකර පූර්ණ හානි නිවාස 2142 ක් හා අර්ධ හානි නිවාස 9956 ක් සඳහා නිවාස ආධාර ලබා දීමට මෙම වසර තුළ කටයුතු කර තිබේ.

02. අවධානම් සහිත ස්ථානයන් හී ඉදිකිරීම් සිදුකරන අවස්ථාවන්හි දී නතර කිරීමේ නෛතික බලය ලැබෙන පරිදි ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පනත සංශෝධනය කිරීම.

03. දිවයින පුරා යම් යම් ප්‍රදේශයන්හි බහුලව සිදුවන අකුණු අනතුරු අවම කිරීමේ කර්යය යටතේ ශ්‍රී ලංකා අකුණු ආරක්ෂණ පනත සකස් කිරීමේ කටයුතු ආරම්භ කිරීම.

04. බියගම පැෂන් වත්ත ප්‍රදේශයේ නායයෑමට අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2014 අයවැය ප්‍රතිපාදන යටතේ මුදල් වෙන්කිරීම

05. ආපදා කළමනාකරණය සඳහා වන සම්බන්ධිකරණ කටයුතු පහසු කරවා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් එක් උපාධිධාරියෙකු පත්කිරීමේ යෝජනාවට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා දැනට 310 ක් අනුයුක්ත කර ඇති අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා දැනට 23 කු අනුයුක්ත කර ඇත.

- ✓ **ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම**

මෙම පනත 2005 වර්ෂයේ සකස් කර ඇති අතර, ප්‍රායෝගිකව පනත ක්‍රියාත්මක වීමේ දී ඇති වූ ගැටළු අවම කර ගැනීම සඳහා කරන ලද සංශෝධන ඇතුලත් සංශෝධිත පනත් කෙටුම්පත සකස් කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ලබාගැනීම සඳහා ඉදිරිපත් කල අතර, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් කරන ලද පළමු සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අමාත්‍යාංශ නිරීක්ෂණ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත නැවත වරක් යොමු කර ඇත. පනත සංශෝධනය වීමෙන් පසු මිනිසා විසින් සහ ස්වාභාවිකව ඇතිවන්නා වූ ආපදා සඳහා ඉතා කඩිනම් ආවරණයක් සැපයිය හැකි වනු ඇත.

- ✓ **ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය**

වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ආපදා කළමනාකරණය සිදු කිරීම සඳහා අවකාශ සැලසෙන අයුරින් අමාත්‍යාංශය විසින් ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය සකස්කර අවසන්කර ඇති අතර, එය අමාත්‍යමණ්ඩල අනුමැතිය සඳහා යොමු කරන ලද අතර, එය මුදල් අමාත්‍යාංශය හා නිවාස පොදුපහසුකම් අමාත්‍යාංශය මඟින් ලබා දෙන ලද නිරීක්ෂණ ඇතුලත් කිරීමට යටත්ව අනුමත කර ඇත.

- ✓ **ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධාන පනත**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට නීතිමය වශයෙන් පිළිගැනීමක් ඇතිකිරීම සඳහා 2011 වසරේ ආරම්භ කරන ලද ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සඳහා වන පනත් කෙටුම්පත මේ වන විට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති අතර, එම දෙපාර්තමේන්තුව විසින් එහි පළමු කෙටුම්පත සකස්කර අවසන් කරඇත. නීතිපතිවරයාගේ අනුමැතිය ලැබීමෙන් පසු නැවත වරක් නීතිකෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් වෙනස්කම් සිදුකර ඇත. ඒ සඳහා අමාත්‍යාංශයේ නිර්දේශ ද යොමු කර ඇත. දැනටමත් ලාභ ලබන ආයතනයක් වන ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත නිතිමය පිළිගැනීමක් ලබාදීම තුලින් නායයෑම් අවදානම අවම කිරීමට අදාල පර්යේෂණ , ක්ෂේත්‍ර සමීක්ෂණ සහ අනිකුත් අදාල කටයුතු සාර්ථකව සහ කාර්යක්ෂමව මෙන්ම ඵලදායි අන්දමින් සම්පූර්ණ කිරීමටත්, එම ආයතනයෙන් ලබාදියහැකි තාක්ෂණික සේවය උපරිම මට්ටමින් සලසාදීමටත් හැකිවනු ඇත. එසේම ආයතනයේ මුදල් ඉපයීමේ ක්‍රය ශක්තිය වර්ධනයට ද එය ඉවහල් වනු ඇත.

- ✓ **ශ්‍රී ලංකා අකුණු ආරක්ෂණ පනත**

ශ්‍රී ලංකාවේ මෑතක දී අකුණු අනතුරු බහුල වීම නිසා 2013 මැයි මස 17 දින හා අංක: අමප/12/0598/548/002 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අකුණු ආරක්ෂණය පිළිබද ජාතික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම හා අකුණු ආරක්ෂණය පිළිබද අවශ්‍ය නීති පැනවීම සඳහා පනතක් සකස් කිරීමේ කටයුතු සඳහා කමිටුවක් පත්කරන ලදි. එම කමිටුව මඟින් පනත කෙටුම්පත් කොට අවසන් කර ඇති අතර, ඒ සඳහා පාර්ශවකරුවන්ගේ අදහස් ලබාගැනීමට නියමිතව ඇත . දැනටමත් එම මධ්‍යස්ථානය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කර ඇති අතර, මේ තුලින් ශ්‍රී ලංකාවේ අකුණු අනතුරු මඟින් සිදුවන ජීවිත හා දේපල හානි අවම කරගැනීමේ හැකියාව වර්ධනය සඳහා උපදෙස් හා දැනුවත් කිරීම් ක්‍රියාත්මක කරනු ලැබේ. එය සුරක්ෂිත ප්‍රජාවක් සංස්කෘතියක් සහ රටක් ඇතිකිරීමට උපකාරි වේ.

✓ **නීතිමය කටයුතු**

2013 වසරට අදාලව අමාත්‍යාංශයට එරෙහිව පැවරුණු නීති කෘත්‍යයන් ගණන 03 ක් වන අතර, ඊට අදාලව නඩු වාර අටක් (8) මෙම වසර තුළ විභාගයට ගෙන ඇත. මෙම නීති කෘත්‍යන් තුන අතරින් එකක් සමතයකට පත්වී ඇති අතර, ඉතිරි නීති කෘත්‍යයන් 02 තවදුරටත් විභාග වෙමින් පවති. 2012 වසර හා සැසඳීමේ දී 2013 වසරේ අමාත්‍යාංශයට එරෙහිව පැවරී ඇති නීති කෘත්‍යයන් ගණන හයේ (6) සිට තුන (3) දක්වා අඩු වී ඇති බව පැහැදිලි වේ.

**අන්තර් කාලීන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම**

✓ **ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය**

2007.03.13 දිනැති අංක 07/0435/343/002 දරණ කැබිනට් පත්‍රිකාව මගින් අනුමැතිය ලැබ මෙම කමිටුව පිහිටුවන ලදි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පරිපාලනමය, මූල්‍යමය හා කළමනාකාරිත්ව බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සහ අනෙකුත් වැදගත් තීරණ ගැනීම පිණිස පිහිටුවන ලද අන්තර් කාලීන කළමනාකරණ කමිටුව මසකට වරක් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතීත්වයෙන් රැස්වේ. සාමාජිකයින් අට (8) දෙනෙකුගෙන් සමන්විත මෙම කමිටුව 2013 වර්ෂය තුළ රැස්වීම් වාර දොළහක් (12) පවත්වා ඇති අතර එහිදි ගන්නා ලද තීරණ අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් සපයනු ලබන සේවාවන් වඩාත් කාර්යක්ෂම කිරීමට හැකිවී ඇත.

✓ **ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ යහ පාලනය , කළමනාකරණය සහ මූල්‍ය පාලනය විධිමත් කිරීමේ අරමුණින් මෙම අන්තර්කාලීන කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත. රාජ්‍ය ව්‍යවසායන්හි යහ පාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන යටතේ ස්ථාපිත කර ඇති මෙම කමිටුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ සභාපතීත්වයෙන් යුත් සාමාජිකයින් සත් දෙනෙකුගෙන් (07) සමන්විත වන අතර, එමගින් ඉහත විධිවිධානයන්ට අනුකූලව තීරණ ගැනීම , මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සිදුකරනු ලබයි. 2013 වර්ෂය තුළ රැස්වීම් වාර දහතුනක් (13) පවත්වා ඇත.

✓ **ජාත්‍යන්තර හා කලාපීය සහයෝගීතාවය**

ආපදා අවම කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන විමර්ශනය කිරීම හා ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු හඳුනා ගැනීම පිළිබද ජිනිවාහි දී පැවති ආපදා අවම කිරීම පිළිබද සාකච්ඡාවට සහභාගී වීම හා දකුණු කොරියා අධිකරණ අමාත්‍යාංශය හා ව්‍යාපාරික ප්‍රජාව සමග ශ්‍රී ලංකාවේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති පිළිබද සාකච්ඡාවට අමාත්‍යාංශය නියෝජනය කරමින් සහභාගීවීම සිදුකරන ලදි.

✓ **මහජන පැමිණිලි**

2013 වර්ෂය සදහා අමාත්‍යාංශය වෙත මහජන පැමිණිලි 35 ක් ලැබුණු අතර, එම පැමිණිලි අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය , කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය , ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා අදාළ රේඛීය අමාත්‍යාංශ වෙත අවශ්‍ය කටයුතු කිරීම සදහා යොමු කර ඇත. එම පැමිණිලි සම්බන්ධයෙන් මෙම ආයතනය ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබද පසුවිපරම් කිරීම ද සිදුකරනු ලැබිණි. 2012 වසර තුල අමාත්‍යාංශය වෙත ලැබුණු මහජන පැමිණිලි ගණන අසූ එකක් (81) වේ. ඒ අනුව මහජන පැමිණිලි ප්‍රමාණයේ පැහැදිලි අඩුවීමක් දක්නට ලැබේ.

✓ **ඵලදායිතා / කළමනාකරණ කව ස්ථාපිත කිරීම**

ක්‍රමවිධි හා ක්‍රියා පිළිවෙත් සංවර්ධනය කිරීම සඳහා ක්‍රමවත්ව වැඩ බෙදීම හා සෑම අංශයකටම අදාළව විෂය මූලික වැඩපියවර සටහන් සැකසීම සිදු කරන ලදි. අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන හතරෙහිම පුරවැසිලාභි ප්‍රඥප්තිය ත්‍රෛභාෂාවෙන් සකස් කරන ලද අතර, අමාත්‍යාංශයේ පුරවැසි සේවාලාභි ප්‍රඥප්තිය අන්තර්ජාලය වෙත මුදාහැර ඇත. තවද, සම්පත් භාවිතයේ අරපිරිමැස්ම අරමුණු කරගනිමින් වායු සමීකරණ යන්ත්‍ර පෙ:ව: 10.00 සිට ප:ව: 03.00 දක්වා පමණක් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදුකරන ලදි.

✓ **පුහුණු වැඩසටහන්**

**<u>දේශීය පුහුණු</u>**

අමාත්‍යාංශයේ නිලධාරීන් ගේ කාර්යක්ෂමතාවය වර්ධන කිරීමේ අරමුණින් දීර්ඝකාලීන පුහුණු වැඩසටහන් හතරක් (4) සඳහා නිලධාරීන් දොළොස් දෙනෙකු (12) යොමු කරන ලද අතර, නිලධාරීන් තිස්පස් දෙනෙකු (35) කෙටි කාලීන පුහුණු වැඩසටහන් එකොළහක් (11) සඳහා යොමු කරන ලදි.

**<u>විදේශීය පුහුණු</u>**

සමුළු, රැස්වීම් හා සම්මන්ත්‍රන සඳහා අමාත්‍යාංශය නියෝජනය කරමින් වැඩමුළු දහතුනක් (13) සඳහා නිලධාරීන් සහභාගී වී ඇත.

✓ **අමාත්‍ය මණ්ඩල සංදේශ හා තීරණ**

2006 වසරේ සිට 2013 වසර දක්වා වූ කාලය තුළ අමාත්‍යාංශය විසින් විවිධ විෂයයන් හා කරුණු පදනම් කරගෙන අමාත්‍ය මණ්ඩල සංදේශ අසූ දෙකක් (82) අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. අමාත්‍යාංශයේ හා සමස්ත ශ්‍රී ලංකාවේ අභිවෘද්ධිය උදෙසා ඉදිරිපත් කරන ලද සංදේශ අතරින්,

1. ශ්‍රී ලංකාවේ ජාතික හදිසි අවස්ථා ප්‍රතිචාර ධාරිතාව වර්ධනය කිරීම
2. විදේශාධාර මඟින් ශ්‍රී ලංකාවේ ආපදා ප්‍රතිචාර ජාලය වැඩිදියුණු කිරීම
3. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහා ඩොප්ලර් රේඩාර් පද්ධතියක් ස්ථාපිත කිරීම
4. ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය හා තායිලන්ත සමඟ පෙර සූදානම් හා ස්වාභාවික ආපදා වලක්වා ගැනීමේ අවබෝධතා ගිවිසුමකට එළඹීම
5. බහුල වශයෙන් ආපදා සිදුවිය හැකි දිස්ත්‍රික්කවල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය
6. කැලෑ ගිනි ආපදාව වැළැක්වීම සඳහා කඩිනම් ක්‍රමවේදයන් සකස් කිරීම

වැනි සංදේශ සඳහා ලැබුණු තීරණ හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මහජනතාව අතර පුළුල් දැනුවත් භාවයක් හා ආපදා අවස්ථාවන්හිදි කඩිනම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව ලැබී තිබේ.

ඒ අනුව, 2013 වසර සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ දහ තුනක් (13) ක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, ඒ පිළිබඳ විස්තරපහත සඳහන් පරිදි වේ.

| අ.අ. | විෂයය | අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය හා අනුමැතිය ලද දිනය | ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | 2012 වර්ෂයේ රටේ ඇති වූ හදිසි ආපදා තත්ත්ව වාර්තාව | අමප/13/0018/548/001 2013.01.03 | අනුමැතිය ලැබී ඇත |
| 02 | ආපදා සහන සැලසීම ඵලදායි සහ විධිමත් ලෙස සිදුකිරීම | අමප/13/0034/548/001-I 2013.01.24 | අනුමැතිය ලැබී ඇත |
| 03 | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට වැඩබැලීමේ පදනම යටතේ ආචාර්ය ආසිරි කරුණාවර්ධන මහතා පත් කිරීම | අමප/13/0144/548/002 2013.04.08 | අනුමැතිය ලැබී ඇත |
| 04 | ස්වාභාවික ආපදා සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීම සඳහා වන සාර්ක් ගිවිසුම | අමප/13/0687/548/003 2013.06.06 | අනුමැතිය ලැබී ඇත |
| 05 | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2011 වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම | අමප/13/0708/548/004 2013.06.13 | අනුමැතිය ලැබී ඇත |
| 06 | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2011 වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම | අමප/13/0926/548/005 2013.07.18 | අනුමැතිය ලැබී ඇත |
| 07 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි නිලධාරි හිගය පියවීම සඳහා කෙටිකාලීන විකල්ප ක්‍රියාමාර්ග ගැනීම | අමප/13/1311/548/007 2013.10.17 | අනුමැතිය ලැබී ඇත |
| 08 | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මැදිරියේ කාර්යයේ නියුතු මාණ්ඩලික නිලධාරින් සඳහා නිවාඩු දිමනා ගෙවීම | අමප/13/1336/548/008 2013.10.03 | අනුමැතිය ලැබී ඇත |
| 09 | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට ආචාර්ය ආසිරි කරුණාවර්ධන මහතා පත් කිරීම | අමප/13/0034/548/001-I 2013.10.03 | අනුමැතිය ලැබී ඇත |
| 10 | ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය සඳහා අනුමැතිය ලබා ගැනීම | - | මුදල් අමාත්‍යාංශය හා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය මඟින් මේ සම්බන්ධයෙන් ලබාදී ඇති නිරීක්ෂණ ඇතුලත් කිරීමට යටත්ව අනුමැතිය ලැබී ඇත. |
| 11 | 17 වන සාර්ක් සමුළුවේ දී අත්සන් කරන ලද ස්වාභාවික ආපදා සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීම සඳහා වන සාර්ක් ගිවිසුම සනාථ කිරීම සඳහා ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම | - | මුදල් අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද නිරීක්ෂණ සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි කටයුතු කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| 12 | ජාතික සුරක්ෂිත දිනය සැමරීම 2013 | අමප/13/1716/548/010<br>2013.11.20 | අනුමැතිය ලැබී ඇත |
| 13 | කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් තනතුරට එල්.චන්ද්‍රපාල මහතා පත් කිරීම | අමප/13/1783/548/011<br>2013.12.16 | අනුමැතිය ලැබී ඇත |
| 14 | ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීම | - | කල් තබන ලදි. |
| 15 | ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය සඳහා අනුමැතිය ලබා ගැනීම (මුදල් , නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශ මගින් ලබාදෙන ලද නිරීක්ෂණ ඇතුලත් කොට සකසන ලද අමාත්‍ය මණ්ඩල සටහන) | - | 2014 වසරේ පැවැත්වීමට නියමිත අමාත්‍යමණ්ඩල රැස්වීමේ දී තීරණයක් ගැනීමට නියමිතය. |

✓ **භාණ්ඩ සමීක්ෂණ කාර්යයන්හි ප්‍රගතිය**

2013 වර්ෂයට අදාල අමාත්‍යාංශයේ සියළු භාණ්ඩ සම්බන්ධ සමීක්ෂණ කටයුතු සිදුකර එහි වාර්තාව විගණකාධිපති වෙත යොමු කර ඇත.

✓ **"ජාතික සුරක්ෂිත දිනය"**

2006 මැයි මස 31 වෙනි දිනැති අංක: 06/0984/208/008 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් යෝජිතව අමාත්‍ය මණ්ඩලය විසින් දෙන ලද අනුමැතියට අනුව සෑම වසරකම දෙසැම්බර් 26 වෙනි දින "ජාතික සුරක්ෂිත දිනය" වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිය.

මෙහි අරමුණ වූයේ ස්වාභාවික හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන ආපදා පිළිබඳව මහ ජනතාවගේ දැනුවත් භාවය වර්ධනය කිරිම හා ඒ සඳහා ඔවුන්ගේ අවධානය යොමු කරවීම, ආපදා අවම කිරීම, වැලැක්වීම හා පූර්ව සූදානම යන ක්ෂේත්‍ර කෙරෙහි ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම හා විශේෂයෙන්ම 2004 දෙසැම්බර් මස 26 වෙනි දින ඇති වූ සුනාමි වැනි ව්‍යසනයන්ට ඉදිරියේ දී නිසි ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වර්ධනය කිරීමත්ය. එම කරුණු පෙරදැරිව 2013 දෙසැම්බර් 26 වෙනි දින මෙම උත්සවය කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දී ගරු අග්‍රාමාත්‍ය තුමන්ගේ ප්‍රධානත්වයෙන් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ද සහාය ඇතිව අටවෙනි (08) වතාවටත් සාර්ථකව පවත්වන ලදි.

මෙම වැඩසටහනට සමගාමීව අමාත්‍යාංශයේ මහපෙන්වීම යටතේ ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ජලාශ අශ්‍රිතව දැනුවත් කිරීමේ පුවරු සවිකිරීම, ජාතික මට්ටමේ චිත්‍ර හා රචනා තරඟ පැවැත්වීම සිදුකරන ලදි. මීට අමතරව බේරුවල, අගලවත්ත හා මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනෙහි ආපදා සඳහා ඔරොත්තු දිය හැකි ආදර්ශ නිවාස තුනක් ඉදිකිරීම සිදු කරන ලදි.

✓ "දැයට කිරුළ" සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය

දැයට කිරුළ ප්‍රදර්ශනය , ප්‍රදර්ශන මට්ටමින් පමණක් නොව ඒ තුළින් රටේ සංවර්ධන කාර්යයට උර දීමක් වශයෙන් විවිධ පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරිමේ ක්‍රම වේදය ආරම්භකල 2010 වර්ෂයේ සිට මේ දක්වා එවැනි සංවර්ධන වැඩසටහන් වසර හතරක දී (04) මහනුවර, බුත්තල, අනුරාධපුර, අම්පාර, කුලියාපිටිය වශයෙන් විවිධ ප්‍රදේශවල පවත්වා ඇති අතර, එම අවස්ථාවන්හී දී ප්‍රාදේශීය මට්ටමින් ආපදා අවම කිරීමේ සුළු පරිමාණයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, විසිරි ජල පද්ධති බෙදාදීම, වැසිජල ටැංකි බෙදාදීම, කාලගුණ විද්‍යාව හා ස්වාභාවික ව්‍යසන සම්බන්ධ දැනුවත් කිරීම්,වර්ෂාමාපක ස්ථාපිත කිරීම්, නායයෑම් අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදී වශයෙන් විවිධ කාර්යයන් ඔස්සේ මහජනතාව වෙත සහන සැලසීම සිදු කර ඇත.

2013 වර්ෂයේ දී මෙම ජාතික සංවර්ධන වැඩසටහන අම්පාර හාඩි විද්‍යාල භූමියේ දී පැවැත්වුණු අතර, ඊට සමගාමීව සැලසුම් කරන ලද ව්‍යාපෘති අමාත්‍යාංශය යටතේ ඇති අනුබද්ධිත ආයතන මගින් ක්‍රියාත්මකිරිම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැපයීම , සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචනයට අදාල කටයුතු පිලිබඳ වගකීම අමාත්‍යාංශය මඟින් සිදුකරන ලදි. මීට අමතරව 2014 වර්ෂයේ පැවැත්වීමට නියමිත දැයට කිරුළ සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනයට අදාල මූලික සැලසුම් හා ක්‍රියාකාරකම් ද ක්‍රියාත්මක කරන ලදි.

✓ ඩෙංගු මර්දන වැඩසටහන


2013 වසර සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ජාතික මදුරු මර්දන සති අවස්ථා තුනක දී ප්‍රකාශයට පත් කරන ලද අතර, ඒ සෑම අවස්ථාවකදීම අමාත්‍යාංශය මගින් විශේෂ පිරිසිදු කිරීම් කටයුතු සිදු කරන ලදි. අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයන්ගේ ද සහයෝගය මේ සඳහා ලබා ගන්නා ලදි. මීට අමතරව මදුරුවන් බෝවිය හැකි ස්ථාන හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරින් දැනුවත් කොට බී.ටී.අයි රසායනය යෙදීම හා මදුරු මර්දන තෙල් ඉසීම සිදු කරන ලද අතර, ජාතික ඩෙංගු මර්දන ඒකකයේ නිලධාරීන්ගේ සහාය ඇතිව අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වන ලදි. අමාත්‍යාංශ පරිශ්‍රය තුළ සතිපතා සිදුකරනු ලබන පිරිසිදු කිරීම් කටයුතු සම්බන්ධ ප්‍රගතිය මාසිකව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත නොකඩවා වාර්තා කිරිම සිදු කරනු ලැබීය.






**මූල්‍ය ප්‍රගතිය - 2010 – 2013**

2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් වූ ආකාරය හා වියදම් කල ආකාරය පහත පරිදි විස්තර කෙරේ.




මූලාශ්‍රය: ආපදා කළමනාකරණ අමාත්‍යාංශය




මූලාශ්‍රය: ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

2010-2013 දක්වා වූ කාලසීමාව තුල දී වැඩිම ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණයක් අමාත්‍යාංශය වෙත ලැබී ඇත්තේ 2011 හා 2013 වසර දෙක සඳහාය. එයට හේතුව 2011 වසරේ දී දිස්ත්‍රික්ක විසි තුනකට (23) බලපෑ ගංවතුර තත්ත්වයට ආපදා සහන ලබාදීමට සිදුවීමත් සහ 2013 වසරේ දී නිවාස සහන ලබාදීමට ආපදා ළමනාකරණ අමාත්‍යාංශයට ප්‍රතිපාදන ලබාදිමත් හේතුවෙනි.

## 03. සැළසුම් හා සංවර්ධන කටයුතු


✓ සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය

අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ආපදා කළමනාරණ මධ්‍යස්ථානය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් දේශිය හා විදේශිය අරමුදල් භාවිතා කරමින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘති සම්බන්ධිකරණය හා අධික්ෂණ කටයුතු සංවර්ධන හා සැලසුම් අංශය මගින් සිදුකරනු ලබයි.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතියට නිර්දේශ සහිතව ව්‍යාපෘති ඉදිරිපත් කිරිම, මූල්‍ය ආයතන (Donor Agencies) සමග අවශ්‍ය සම්බන්ධිකරණය කිරිම, මහ භාණ්ඩාගාරයෙන් අවශ්‍ය ප්‍රතිපාදන සහ අක්මුදල් නිසි වේලාවට නිදහස් කර ගැනිම සඳහා අවශ්‍ය සම්බන්ධිකරණ කටයුතු සිදුකිරිම මෙන්ම සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘතිවලට අදාල ප්‍රගති සමාලෝචන කටයුතු සිදුකර ප්‍රගතිය විමර්ශණය කිරිම තුලින් අපේක්ෂිත අරමුණු/ඉලක්ක ලගාකරගැනිම සහ පැනනැගි ඇති ගැටළු නිරාකරණය කරගැනිම සඳහා අවශ්‍ය උපදෙස් සහ මගපෙන්විම ලබාදෙන ලද අතර, එය අදාල ප්‍රදේශවල ආපදා අවම කිරීම සඳහා ඉවහල් විය.

2013 වසරේදි ඒ ඒ ආයතන විසින් නම්කරන ලද නිලධාරින්ගෙන් සමන්විත ව්‍යාපෘති අධික්ෂණ හා ක්‍රියාකාරි කණ්ඩායමේ රැස්විම් වාර 10ක් පවත්වා, ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති නිසිලෙස අවසන් කිරිමට කටයුතු කර ඇත.

කාර්යක්ෂම හා ඵලදායි ව්‍යාපෘති අධික්ෂණ යාන්ත්‍රණයක් සැලසුම් අංශය විසින් පසුගිය වසර කිහිපය තුලදි ක්‍රියාත්මක කිරිම තුලින්, ඒ ඒ ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්හි අපේක්ෂිත අරමුණු ලගාකරගත් හෙයින් ආපදා කළමනාකරණය පිළිබඳ මහජනතාව නිරන්තර අවධානයෙන් පසුවන අතර ඒ සඳහා දක්වන ප්‍රතිචාරය ඉහල මට්ටමක පවති. පසුගිය වර්ෂ හා සසදා බැලිමේදි ආපදා කළමනාකරණය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වර්ධනය වී ඇති අතර එම ප්‍රතිපාදන උපයෝගිකරගෙන සිදුකරන ලද ආපදා අවම කිරිමේ වැඩසටහන්හි වර්ධනයක් ද පෙන්වයි.




මූලාශ්‍රය : ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

2013 වර්ෂයේ දී පහත සඳහන් ව්‍යාපෘති ක්‍රමවත් පරිදි අධීක්ෂණය කිරිම මඟින් ඒ ඒ ව්‍යාපෘති වලට අදාල ප්‍රදේශවල ආපදා අවම කරගැනීමට හැකි වූ අතර, එම ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ සමාජ හා ආර්ථික තත්ත්වය නගාසිටුවීමට එමඟින් හැකියාව ලැබුණි.

- නායයෑම් ආපදා කලාප සිතියම් ගත කිරීමේ ව්‍යාපෘතිය
- පානදුර, යාපනය හා දඹුල්ල ප්‍රදේශයන් හි ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘතීන්
- දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරන කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ආපදා අවම කිරීමේ වැඩසටහන්
- ඩොප්ලර් රේඩාර් පද්ධතියක් දෙනියාය ගොන්ගල ප්‍රදේශයේ ස්ථාපිත කිරිම
- ගැරඬිඇල්ල නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය
- එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ ආධාර (UNHABITAT) යටතේ පූර්ව දැනුම්දීමේ පද්ධතියක් ස්ථාපිත කිරිම
- හදිසි ආපදා සහන සේවා සැපයීම

### ✓ මධ්‍ය කාලීන ආයෝජන සැලැස්ම 2013 - 2015

ආපදා කළමනාකරණ කටයුතු කඩිනම්ව හා විධිමත්ව සැලසුම් කර ක්‍රියාත්මක කිරිම සඳහා සංයුක්ත සැලැස්මට අනුකූලව මධ්‍යකාලීන ආයෝජන සැලැස්ම (2013-2015) සකස් කරන ලදි. මහින්ද චින්තන ප්‍රතිපත්ති රාමුවේ අන්තර්ගත ජාතික අරමුණු හා ප්‍රමුඛතාවයන්ට අනුව අමාත්‍යාංශයේ අභිමතාර්ථ ඉටුකර ගැනීම සඳහා මෙම අමාත්‍යාංශයේ විෂය පථය තුළ හඳුනාගත් අරමුණු , කාර්ය සාධන දර්ශකයන් හා උපායමාර්ගික ක්‍රියාකාරකම් පදනම් කරගෙන සකස් කරන ලද මධ්‍යකාලීන ආයෝජන සැලැස්ම (2013 – 2015) මගින් ආපදා අවදානම අවම කිරිම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කරන ලදි.

ආපදා කළමනාකරණයට අදාල සියළු පාර්ශවයන්ගේ දායකත්වය අත්‍යාවශ්‍යයෙන්ම හිමිවිය යුතු අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීම, මගපෙන්වීම , අධීක්ෂණය, මෙහෙයුම් හා ඇගයුම් කටයුතු ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් ඉටු කරනු ලැබිය.

### ✓ සංයුක්ත සැලැස්ම 2013 - 2015

ජාතික ප්‍රතිපත්තීන් හා පුමුඛතාවයන් සැලකිල්ලට ගනිමින් අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන් ප්‍රධාන අභිමතාර්ථ තුනක් (3) පදනම් කරගනිමින් අරමුණු, කාර්යසාධන දර්ශකයන්, උපායමාර්ග හා අපේක්ෂිත ප්‍රතිඵල සැලසුම්කර ක්‍රියාත්මක කිරිම සඳහා වර්ෂ තුනක කාල පරිච්ඡේදයක් වෙනුවෙන් අමාත්‍යාංශ සංයුක්ත සැලැස්ම භාෂා ත්‍රිත්වයෙන්ම සකස් කරන ලදි.

ඒ අනුව, ආපදා කළමනාකරණයට අදාලව කෙටි කාලින , මධ්‍ය කාලීන හා දිගු කාලීන සැලසුම් සකස් කර ඇත. ආපදා අවදානම අවම කිරිමටත්, පශ්චාත් ආපදා සහන මත යැපීමේ මානසිකත්වයෙන් මිදී අපදා අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරිම තුලින් තිරසාර සංවර්ධනය පවත්වාගනිමින් සුරක්ෂිත ශ්‍රී ලංකාවක් ගොඩනැගීමේ පිවිසුම මෙමගින් පැහැදිලි කර ඇත. මෑත කාලයේ දේශගුණික විපර්යාස ඇතිවීමේ වැඩි ප්‍රවණතාවයක් සහ ඒ තුලින් සිදුවන ආපදා වැඩිවීමත් සැලකිල්ලට ගනිමින් පවතින වර්ෂයට සාපේක්ෂව ඉදිරි වර්ෂ තුන සඳහා උපාය මාර්ග හා ක්‍රියාකාරකම් සැලසුම් කර මෙම සංයුක්ත සැලැස්ම සකස් කරන ලදි.

✓ **මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මට අදාල කාර්තුමය ප්‍රගතිය වාර්තා කිරීම**

මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම පෙරදැරි කොටගෙන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ ද ඇතැම් කාර්යයන් ඇතුලත් කොට ඇති අතර, එම කාර්යයන්හි කාර්තුමය ප්‍රගතිය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

✓ **2014 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති අනුමැතිය සඳහා යොමු කිරීම**

රට තුල ආපදා අවම කිරීම කෙරෙහි රජයේ විශේෂ අවධානය යොමු කිරීම හේතුවෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා ලද ආපදා අවම කිරීමේ ව්‍යාපෘති යෝජනා වල වැඩිවීමක් සිදුවී ඇත. දේශීය හා විදේශීය අරමුදල් හා ආධාර යටතේ 2014 වසර තුළ ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගත් ව්‍යාපෘති 478 න් ක්‍රියාත්මක කල හැකි මට්ටමේ පැවති ව්‍යාපෘති 156 ක් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කරන ලදී.

✓ **ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ සමස්ත වැඩසටහන (2014 – 2018) සකස් කිරීම**

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් සභාපතීත්වය දරණ ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ දී ගත් තීරණයන් ක්‍රියාවට නංවමින් ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ සමස්ත වැඩසටහන (2014-2018) සකස් කිරීම 2013 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. රාජ්‍ය ආයතන හා දෙපාර්තමේන්තු , රාජ්‍ය නොවන ආයතන හා සංවිධාන , විශ්ව විද්‍යාල හා ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ විද්වතුන් ඇතුළු සියළුම පාර්ශවයන්ගේ අදහස් ලබාගනිමින් සකස් කරන ලද ශ්‍රී ලංකා සමස්ත ආපදා කළමනාකරණ වැඩසටහන ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබීය. තවද, මෙමගින් හඳුනාගත් ක්‍රියාකාරකම් 2014 වර්ෂය තුළ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.





**04. ගිණුම් කටයුතු**

✓ වියදම් ඇස්තමේන්තුව - 2013

| | අමාත්‍ය කාර්යාලය 106-01-1 | | පරිපාලන හා ආයතනික සේවා 106-01-2 | | ආපදා සහන මෙහෙයුම් 106-02-4 | |
|---|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| 1. ඇස්තමේන්තු ප්‍රතිපාදන | 44,350,000.00 | 2,500,000.00 | 56,500,000.00 | 51,450,000.00 | 244,600,000.00 | 13,325,000.00 |
| 2. මු.රෙ 66 යටතේ මාරුකිරිම් සහ පරිපූරක ප්‍රතිපාදන | 7,777,600.00 | 25,420,304.00 | 2,707,500.00 | 58,400,000.00 | 45,366,197.00 | 447,727,822.00 |
| 3. ශුද්ධ ප්‍රතිපාදන | 52,127,600.00 | 27,920,304.00 | 59,207,500.00 | 109,850,000.00 | 289,966,197.00 | 461,052,822.00 |
| 4. වියදම | 51,580,042.51 | 27,824,260.63 | 53,701,531.00 | 88,673,862.00 | 216,659,017.87 | 368,226,780.24 |
| 5. වියදම් ප්‍රතිශතය | 98.95 % | 99.66 % | 90.70 % | 80.72 % | 74.72 % | 79.87% |

✓ **වියදම් සඳහා මූල්‍ය කරණය**

| සංකේතය | වියදම් මූල්‍යකරණය | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම |
|---|---|---|---|
| 11 | දේශිය අරමුදල් | 210,105,404.00 | 202,330,096.14 |
| 12 | විදේශිය ආධාර ණය | - | - |
| 13 | විදේශිය ආධාර ප්‍රධාන | 39,000,000.00 | 18,708,860.00 |
| 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | - | - |

✓ **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම**

| | වියදමෙහි උපරිම සීමාව | ලැබීමේ අවම සීමාව | උපරිම හර ශේෂ සීමාව |
|---|---|---|---|
| විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාව | 4,000,000.00 | 2,500,000.00 | 16,000,000.00 |
| 2013.12.31 දිනට සත්‍ය අගය | 2,850,000.00 | 2,796,807.00 | 9,270,146.50 |

✓ **2013.12.31 දිනට ණය / අත්තිකාරම්**

| ණය වර්ගය | ණය ප්‍රමාණය | ණය ලබාගත් සංඛ්‍යාව |
|---|---|---|
| 01. උත්සව අත්තිකාරම් | 415,000.00 | 83 |
| 02. විශේෂ අත්තිකාරම් | 42,500.00 | 17 |
| 03. ආපදා ණය | 2,392,500.00 | 23 |
| 04. පාපැදි ණය | - | - |

2013 විසර්ජන ගිණුම සහ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් " බී" ගිණුම 2013.12.31 දිනට සකස් කර මේ වන විට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත.

✓ **වෙනත්**

2013 වසර සඳහා විගණන විමසුම් පහක් (05) ක් ලැබී ඇති අතර, එකී විගණන විමසුම් පහ (5) සඳහාම පිළිතුරු ලබා දී ඇත. පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාව හා විගණන රැස්වීම් වාර්තා මගින් පෙන්වා දී ඇති කරුණු නිවැරදි කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

05. **ප්‍රසම්පාදන කටයුතු**

✓ **2013 වර්ෂය තුල අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන වියදම් පිළිබඳ විස්තර (රු.මි.)**

<u>අමාත්‍ය කාර්යාලය</u>

**1201 - ලිපිද්‍රව්‍ය**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - 1.15 |
| වියදම | - 1.14 |
| මූල්‍යමය ප්‍රගතිය | - 99.67% |

**2102 - ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ සඳහා**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - 1.15 |
| වියදම | - 1.15 |
| මූල්‍යමය ප්‍රගතිය | - 99.70% |

**2103 - යන්ත්‍රෝපකරණ**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - 1.0 |
| වියදම | - 0.99 |
| මූල්‍යමය ප්‍රගතිය | - 99.77% |

<u>අමාත්‍යාංශ කාර්යාලය</u>

**1201 - ලිපිද්‍රව්‍ය**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - 1.60 |
| වියදම | - 1.58 |
| මූල්‍යමය ප්‍රගතිය | - 99.14% |

**2102 - ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ සඳහා**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - 1.0 |
| වියදම | - 0.99 |
| මූල්‍යමය ප්‍රගතිය | - 99.91 % |

**2103 - යන්ත්‍රෝපකරණ**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - 1.0 |
| වියදම | - 0.98 |
| මූල්‍යමය ප්‍රගතිය | - 98.03 % |

2013 ප්‍රසම්පාදන සැලැස්මට අනුව සියළු ප්‍රසම්පාදන කටයුතු නිමකර ඇත.

06. **අභ්‍යන්තර විගණන කටයුතු**

2013 වර්ෂය සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය ආශ්‍රිතව විගණන පරීක්ෂණ හතරක් (04) සිදුකර ඇති අතර, අදාල වර්ෂය සඳහා විශේෂ විමර්ශන කිසිවක් සිදුකර නොමැත.

2013 වර්ෂය සඳහා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් (3) පවත්වා ඇත. 2013 වර්ෂය සඳහා විගණන විමසුම් හතක් (7) ලැබී ඇති අතර, එකී විගණන විමසුම් හත (7) සඳහාම පිළිතුරු සපයා ඇත.

✓ **2013 වර්ෂයට අදාල විගණන විමසුම් හා එම විමසුම් වලට ලබාදුන් පිළිතුරු පිළිබඳ විස්තර**

| විගණන විමසුම් දිනය | විගණන විමසුම් අංකය | විෂයය | පිළිතුරු යැවූ දිනය |
|---|---|---|---|
| 2013.05.17 | ඩීර්/ජී/එම්ඩීඑම්/වි.ගි/2011 | විසර්ජන ගිණුම - 2012 වර්ෂය | 2013.05.23 |
| 2013.06.03 | ඩීර්/ජී/එම්ඩීඑම්/වි.ගි/2012 | විසර්ජන ගිණුම - 2012 වර්ෂය | 2013.06.05 |
| 2013.06.12 | ඩීර්/ජී/එම්ඩීඑම්/ර.නි.අ.බි/2012 | රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බි ගිණුම -2012 ගිණුම් අංක - 106011 | 2013.06.19 |
| 2013/02/06 | ඩීර්/ජී/එන්ඩීආර්එස්සි/වි.ගි 01/2012 | නිළධාරීන්ගේ නිවාඩු පිළිබඳ පරීක්ෂාව | 2013.03.08 |
| 2013.02.28 | ඩීර්/ජී/එන්ඩීආර්එස්සි/වි.ගි 02/2012 | හදිසි ආපදා තත්වයකදී ජනතාවට සහන සැලසීම පිළිබඳ පරීක්ෂාව | 2013.04.08 |
| 2013.08.21 | ඩීර්/ජී/එම්ඩීඑම්/ක.වි.වා/2011 | විසර්ජන ශීර්ෂය - 106 - ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන වාර්තාව 2012 | 2013.08.29 |
| 2013.09.10 | ඩීර්/ජී/එම්ඩීඑම්/154(6)/2012 | විසර්ජන ශීර්ෂය 106 ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාර 2012 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව | 2013.09.17 |

අමාත්‍යාංශයේ වවුචර් පරික්ෂාව, නිවාඩු ලේඛන පවත්වාගෙන යාම, භාණ්ඩ සමීක්ෂණ වාර්තා, පෞද්ගලික ලිපිගොණු, කාර්ය සාධන සැලැස්ම හා විසර්ජන ගිණුම, වාර්ෂික ඇස්තමේන්තුව, ප්‍රසම්පාදන සැලැස්ම ආදිය අභ්‍යන්තර විගණන පරික්ෂාවට ලක් කිරීම තුළින් කාර්යයන් නිවැරදි කිරීම හා කලට වේලාවට නිම කිරීමට හැකි වූ අතර, ආපදා අවස්ථාවල දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ආපදා සහන ලබාදීම හා ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් සම්පත් උපයෝජනය කාර්යක්ෂම කිරීම සිදු කල හැකි විය.

07. **ජාතික ආපදා සහනසේවා කටයුතු**

✓ **හැඳින්වීම**

ආපදා සහනසේවා කටයුතු වලදී අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය කාර්යක්ෂම සේවයක් සලසන අතර, 1996 වර්ෂයේදී සමාජ සේවා සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලදී. සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සැලසුම් කරනු පිණිස හා ක්‍රියාත්මක කරනු පිණිස එය 2005.12.08 දින අංක 1422/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආපදා සහන සේවා අමාත්‍යාංශය යටතට පත් විය. 2007.01.09 දින අංක 1482/9 දරන ගැසට් නිවේදනය මගින් එය ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය යනුවෙන් නම් කොට නැවත පදිංචි කිරීමේ හා ආපදා සහන සේවා අමාත්‍යාංශය වෙත පවරන ලදී. අංක 1651/220 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව 2010.04.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම මධ්‍යස්ථානය ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙයි.

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් දෙනු ලබන ප්‍රතිපත්ති මාර්ගෝපදේශකත්වය අනුව අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා එහි ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. එමෙන්ම අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ සංවර්ධන සහකාර (ආපදා කළමනාකරණ) සහ සංවර්ධන නිලධාරී (ආපදා සහනසේවා) ආපදා සහන සම්බන්ධීකාරකවරු ලෙස ක්‍රියා කරති.

✓ **ඉලක්ක සහ ක්‍රියාකාරකම්**

| **ඉලක්ක** | **ක්‍රියාකාරකම්** |
|---|---|
| පසු ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම | කාර්යක්ෂම ආපදා සහන සේවාවක් තුලින් සුදුසු ප්‍රතිලාභියා වෙත ආපදා සහන ලබා දීම.<br>ආපදා හේතුවෙන් හානියට ලක්වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරිම<br>පසු ආපදා කළමණාකරන ක්‍රියාවලින් පිළබඳ ආපදා සහන සේවා නිළධාරින් බලමුළු ගැන්විම |
| තොරතුරු සන්නිවේදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම | අන්තර්ජාල තොරතුරු පද්ධතිය මගින් ආපදා සිදු වී කෙටි කාලයක් තුළ තොරතුරු ලබා ගැනීම<br>තොරතුරු සන්නිවේදන ජාලය ශක්තිමත් කිරිම |
| ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්ක්‍රියාත්මක කිරිම | ආපදා හේතුවෙන් සිදුවන හානිය අවම කර ගැනීම සඳහා ග්‍රාමීය මට්ටමින් ඇති තරනු ලබන ආපදා කමිටු බලමුළු ගැන්වීම<br>පසු ආපදා තත්තවයන්ට මුහුණදීම සඳහා ප්‍රජාව හා පාසැල් සිසුන් දැනුවත් කිරීම |
| යහ පාලනය ඇතිකිරීම | සහනසේවා ලබාදීම පිළිබඳ මෙහෙයවීම චක්‍රලේක හා මාර්ගෝපදේශ අනුව ක්‍රියාකිරිම |

**2013.12.31 දිනට කාර්යමණ්ඩලය**

| අනු අංකය | තනතුර | සේවය | අනුමත කාර්යය මණ්ඩල ය | තථ්‍ය කාර්යය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්‍ෂ | ශ්‍රී. ල. පරි. සේ | 01 | 01 | - |
| **02** | නියෝජ්‍ය අධ්‍යක්‍ෂ | ශ්‍රී. ල. පරි. සේ | 01 | - | 01 |
| **03** | සහකාර අධ්‍යක්‍ෂ | ශ්‍රී. ල. පරි. සේ | 02 | 01 | 01 |
| **04** | සංවර්ධන සහකාර (ආපදා කළමනාකරණ) | - | 32 | 31 | 1 |
| **05** | සංවර්ධන නිලධාරී (ආපදා කළමනාකරණ) | වැඩසටහන් නිලධාරි සේවය | 04 | 04 | - |
| **06** | සංවර්ධන නිලධාරී (ආපදා සහන සේවා) | වැඩසටහන් නිලධාරි සේවය | 332 | 309 | 23 |
| **07** | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. ක. ස. සේ | 08 | 03 | 05 |
| **08** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිළධාරි ( II පංතිය) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 02 | - | 02 |
| **09** | ව්‍යාපෘති නිලධාරි | - | 01 | - | 01 |
| **10** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර ( III පංතිය) (දත්ත සටහන් ක්‍රියාකරු) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 01 | - | 01 |
| **11** | රියදුරු | රියදුරු සේවය | 07 | 04 | 03 |
| **12** | කාර්යාල කාර්යය සහායක | කා. සේ. සේ | 04 | 04 | - |
| **13** | ලොරි රියදුරු සහායක | - | 05 | 03 | 02 |
| **එකතුව** | | | **400** | **360** | **40** |

**ස්ථාමාරුවීම්**

2013 වර්ෂයේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මස දක්වා අභ්‍යන්තර ස්ථානමාරු දොළහක් (12) සිදුවූ අතර, වෙනත් අමාත්‍යාංශ වෙත ස්ථානමාරු ලැබ යෑම් හා ස්ථාන මාරු ලැබ ඒම් ගණන හතරකි (04). රෙජිස්ටාර් සේවයේ තනතුරක් සඳහා මාරුවීයාම් ගණන එකකි (01)

**පුහුණු වැඩසටහන්**

**දේශීය පුහුණු**

මූල්‍ය පාලනය හා ජී.අයි.එස් භාවිතය, ලිපිගොනුකරණය හා ලිපි සකස් කිරීම, විශ්‍රාම වැටුප් කටයුතු , කාල කළමනාකරණය, මූල්‍ය පාලනය හා ගිණුම්කරණය ආදී වශයෙන් වන දේශීය වැඩමුළු ගණනාවක් සඳහා 2013 වසරේ දී නිලධාරීන් හත් දෙනෙකු (07) යොමු කර ඇත.

✓ **විදේශීය පුහුණු**

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය නියෝජනය කරමින් ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳව ඉන්දුනීසියාවේ පැවති ජාත්‍යන්තර වැඩමුළුව, තායිලන්තයේ පැවති ආපදා ප්‍රත්‍යස්ථිතිය නායකත්ව වැඩමුළුව සඳහා සහ තායිලන්තයේ පැවති " ඕසෝන් " පුහුණු වැඩමුළුව හා ආසියානු කලාපයේ ආපදා සහන සේවා අභ්‍යාස වැඩමුළුව , කාලගුණික විපර්යාස පිළිබඳ අනුගත වීම පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වශයෙන් ජාත්‍යන්තර වැඩමුළු හතරක් (4) සඳහා නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වී ඇත

**මූල්‍ය ප්‍රගතිය**

2013 අයවැයෙන් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සඳහා රුපියල් මිලියන 751.01ක් ප්‍රතිපාදන වෙන් කරන ලදී. එහි පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 289.96 ක් ද, ප්‍රාග්ධන වියදම සඳහා රුපියල් මිලියන 461.05ක් ද ඇතුළත් විය. 2013 දෙසැම්බර් 31 දිනට පුනරාවර්තන වියදම් 75%කි එනම් රුපියල් මිලියන 216.65 කි ප්‍රාග්ධන වියදම 79%කි එනම් රුපියල් මිලියන 368.44 කි. ඒ අනුව සමස්ත වියදම 78%කි එනම් රුපියල් මිලියන 585.27 ක් වේ.

**සහන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - 2013**



ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය (NDRSC) ආපදා සහන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා 2011.06.14 දින සිට යොදා ගන්නා ලද අංක 152 දරන ජාතික අයවැය චක්‍රලේඛය අවලංගු වූ අතර ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීම සඳහා 2013.07.04 දින සිට ජාතික අයවැය චක්‍රලේඛ අංක 152 (I) නිකුත් කරන ලදි.

එහිදී ජාතික අයවැය චක්‍රලේඛ අංක 152 මඟින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා තිබූ නිවාස හානි, වගා හානි හා ස්වයං රැකියා හානි සඳහා සහනාධාර ලබාදීමේ කටයුතු නැවත මෙම අමාත්‍යාංශය වෙත පවරා ඇත.

**කඩිනම් ආපදා සහනාධාර**

මේ යටතේ කඩිනම් ආපදා සහනාධාර කටයුතු සඳහා එනම් ස්වභාවික ආපදාවන් හේතුවෙන් විපතට පත්වන පවුල් සඳහා පිසූ ආහාර, වියළි සලාක, මුළුතැන්ගෙයි උපකරණ, වෘත්තීයමය මෙවලම්, අවමංගල්‍ය සහනාධාර, වෛද්‍යාධාර, වෙනුවෙන් රුපියල් මිලියන 203ක ප්‍රතිපාදන 2013 වර්ෂය සඳහා රජය විසින් වෙන්කර තිබුනි. එයින් 2013 දෙසැම්බර් අවසන් වන විට දිස්ත්‍රික්ක සඳහා මුදාහරින ලද මුළු ප්‍රතිපාදන වල වටිනාකම රු.මි.158.82 ක්වූ අතර, දිස්ත්‍රික්ක විසිපහ (25) තුළ කඩිනම් ආපදා සහන සඳහා වියදම් කරන ලද මුළු මුදල රු.මි.143.94 කි. මෙය ප්‍රතිශතයක් ලෙස 91%.


**2013 වර්ෂයේ කඩිනම් සහනාධාර සඳහා දිස්ත්‍රික්ක වලට ලබාදුන් ප්‍රතිපාදන (රු.මි.)**

| දිස්ත්‍රික්කය | ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි) | වියදම රු.මි. |
|---|---|---|
| අම්පාර | 2.00 | 1.43 |
| අනුරාධපුර | 3.68 | 2.93 |
| බදුල්ල | 1.30 | 0.85 |
| මඩකලපුව | 27.57 | *27.97 |
| කොළඹ | 6.01 | 5.55 |
| ගාල්ල | 3.00 | 0.80 |
| ගම්පහ | 2.57 | 2.40 |
| හම්බන්තොට | 23.21 | 19.02 |
| යාපනය | 4.70 | 4.70 |
| කළුතර | 2.02 | 0.47 |
| මහනුවර | 2.53 | 1.75 |
| කෑගල්ල | 0.06 | 0.06 |
| කිලිනොච්චිය | 9.50 | 9.50 |

| දිස්ත්‍රික්කය | ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) | වියදම රු.මි. |
|---|---|---|
| කුරුණෑගල | 0.45 | 0.40 |
| මන්නාරම | 21.00 | *23.50 |
| මාතලේ | 1.96 | 1.43 |
| මාතර | 1.09 | 0.16 |
| මොණරාගල | 2.73 | 0.84 |
| මුලතිවු | 9.02 | 7.08 |
| නුවරඑළිය | 6.49 | *7.90 |
| පොලොන්නරුව | 5.32 | 5.00 |
| පුත්තලම | 13.55 | 12.47 |
| රත්නපුර | 2.04 | 1.03 |
| ත්‍රිකුණාමලය | 0.02 | 0.02 |
| වවුනියාව | 7.00 | 6.68 |
| එකතුව | 158.82 | 143.94 |

**මූලාශ්‍රය: ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය**

***ලබාදුන් ප්‍රතිපාදන වලට වඩා වියදම් කිරීමක් සිදුකර ඇත.**




**2013/12/31 දිනට කඩිනම් ආපදා සඳහා වියදම් කිරීම**

| විස්තරය | පවුල්/පුද්ගල සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|
| පිසූ ආහාර (පුද්ගල) | 200904 | 45.64 |
| වියළි සලාක (පවුල්) | 278562 | 72.27 |
| මරණාධාර (පුද්ගල) | 138 | 2.07 |
| වෛද්‍ය ආධාර (පුද්ගල) | 13 | 0.10 |
| ස්වයංරැකියා ආධාර (පුද්ගල) | 9 | 0.041 |
| වෘත්තීය මෙවලම් (පුද්ගල) | 1 | 0.003 |
| මුළුතැන්ගෙයි උපකරණ (පවුල්) | 8646 | 12.98 |

මූලාශ්‍රය: ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය

*2012 දෙසැම්බර් ගංවතුරින් ආපදාවට ලක්වූවන් සඳහා සහන සැපයීම වෙනුවෙන් 2013 වර්ෂයේ ලබාදුන් ප්‍රතිපාදයන්හි වියදම මෙහි ඇතළත් වේ.

**නියඟයෙන් පීඩාවට පත් ජනතාවට පානීය ජලය සැපයීම**

2013 වර්ෂයේ අගෝස්තු මස සිට ඇතිවූ වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් වූ ජනතාව වෙනුවෙන් බීමට ජලය සැපයීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි අම්පාර, බදුල්ල,මඩකලපුව, ගම්පහ, යාපනය, මහනුවර, කිළිනොච්චිය, කුරුණෑගල, මාතලේ, මොණරාගල, මුලතිව්, පොළොන්නරුව, පුත්තලම යන දිස්ත්‍රික්කයන් සඳහා රුපියල් මිලියන 12.04 ක ප්‍රතිපාදන ලබාදී ඇත. එමගින් සාමාන්‍ය ජනයාගේ ජනජීවිතය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පානීය ජලය ලබාදීම මඟින් පුද්ගලයින් 201985 ක ගේ ජීවිත වඩාත් සුරක්ෂිත කිරීමට හැකියාව ලැබුණි. මේ සඳහා වැයකරන ලද මුළු මුදල රු.මි.6.26 කි.

කඩිනම් ආපදා සහනාධාර ලබාදීම මගින් පශ්චාත් ආපදා අවස්ථාවන්හිදී සිවිල් ජනජීවිතයට එල්ලවන බලපෑම අවම කිරීමට හැකියාව ලැබී ඇත. ඒ අනුව ආපදාවට ලක්වූ සාමාන්‍ය ජනතාවගේ දෛනික ජනජීවිතය අඛණ්ඩව පවත්වාගෙනයාම සඳහා රජය විසින් ලබාදී ඇති ප්‍රතිපාදන නිසි ප්‍රතිලාභියාට ලබාදීම සිදුකොට ඇත. ආපදා තත්ත්වය සමනයට පත්වී සිවිල් ජන ජීවිතය යථා තත්ත්වයට පත්වන තෙක් ඔවුනට අත්‍යාවශ්‍ය සහනාධාර ලබාදීම තුළින් රටේ සමස්ත සංවර්ධනය කෙරෙහි ඔවුන්ගේ දායකත්වය අඩාල නොවීමට හා ඔවුන්ගේ මානසික සංවර්ධනය ඇති කිරීමට එය ඉවහල් වී ඇත.

**නිවාස සහනාධාර ලබාදීම**

2013.07.04 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 152 (I) අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් 2012 වර්ෂයේ නිවාස හානි සඳහා ගෙවීම් කිරීමට රුපියල් මිලියන 425ක ප්‍රතිපාදන ලබාදෙන ලදි. එම ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 344 ක මුදලක් දිස්ත්‍රික්ක 22ක පූර්ණ හා අර්ධ නිවාස හානි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වියදම් දරා ඇත. ආපදාවකින් හානි වන නිවාස අළුත්වැඩියා කර ගැනීමට හෝ නැවත ඉදිකර ගැනීම සඳහා මෙම සහනාධාරය ලබාදෙන අතර ඒ සඳහා ප්‍රතිලාභියාගේ මාසික ආදායම රුපියල් 3000 හෝ ඊට අඩුවිය යුතුය.මෙසේ පූර්ණ නිවාස හානියක් සඳහා රු.100,000ක් හා අර්ධ නිවාස හානියක් සඳහා රු.50,000ක් ද ගෙවනු ලැබේ.

නිවාස සහනාධාර වල මූල්‍ය වටිනාකම (රුපියල් මිලියන) – 2013


| දිස්ත්‍රික්කය | ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) | පූර්ණ හානි නිවාස ගණන | අර්ධ හානි නිවාස ගණන | වියදම රු.මි |
|---|---|---|---|---|
| අම්පාර | 9.21 | 32 | 295 | 8.98 |
| අනුරාධපුරය | 8.19 | 53 | 135 | 2.35 |
| බදුල්ල | 11.09 | 26 | 536 | 10.24 |
| කොළඹ | 1.24 | 3 | 48 | 0.94 |
| ගාල්ල | 12.42 | 49 | 462 | 10.74 |
| ගම්පහ | 2.10 | 7 | 87 | 2.04 |
| හම්බන්තොට | 79.88 | 373 | 940 | 55.67 |
| යාපනය | 15.47 | 46 | 1346 | 15.44 |
| කළුතර | 9.80 | 32 | 412 | 9.60 |
| මහනුවර | 15.57 | 45 | 673 | 14.58 |
| කෑගල්ල | 4.21 | 16 | 115 | 3.74 |
| කිලිනොච්චිය | 40.69 | 22 | 730 | 29.97 |
| කුරුණෑගල | 50.72 | 440 | 594 | 34.22 |


| | | | | |
|---|---|---|---|---|
| මන්නාරම | 3.90 | 18 | 42 | 3.90 |
| මාතලේ | 51.40 | 248 | 1147 | 38.46 |
| මාතර | 16.43 | 205 | 129 | 15.75 |
| මොණරාගල | 8.22 | 42 | 530 | 8.16 |
| මුලතිව් | 41.95 | 28 | 783 | 41.95 |
| නුවරඑළිය | 2.35 | 8 | 186 | 1.98 |
| පොලොන්නරුව | 17.36 | 352 | 166 | 17.27 |
| රත්නපුර | 15.54 | 88 | 271 | 14.19 |
| ත්‍රිකුණාමලය | 7.26 | 9 | 329 | 4.00 |
| එකතුව | 425.00 | 2142 | 9956 | 344.19 |

මූලාශ්‍රය : ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය










*මූලාශ්‍රය : ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය*

ඉහත සඳහන් පරිදි 2013 වර්ෂයේදී දිස්ත්‍රික්ක 22 සඳහා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙන් පූර්ණ නිවාස හානි 2142 හා අර්ධ නිවාස හානි 9956 ක් සඳහා රුපියල් මිලියන 344.19ක් වැය කරමින් නිවාස යතා තත්ත්වයට පත්කිරීම හා නැවත ඉදිකිරීම් සිදුකර ඇත. මෙහිදී ආපදා හේතුවෙන් නිවාස හානියට පත්වී නිසි රැකවරණයක් හා සමාජ සුරක්ෂිත තාවයක් නොමැතිව සිටින ලද පවුල් 12098 ක ජන ජීවිතය යතා තත්ත්වයට පත්කිරීමට හැකි විය.


**ස්වාභාවික ආපදා සඳහා ප්‍රතිපාදන ලබාදීම**

**2006 සිට 2013 දක්වා වූ ස්වභාවික ආපදාවන්ට ලක්වූ පුද්ගල තොරතුරු**

| වර්ෂය | ගංවතුර | නියගය | සුළිසුළං | නායයෑම් |
|---|---|---|---|---|
| ***2006** | 112947 | 47925 | 827 | 2053 |
| **2007** | 211318 | 93316 | 6647 | 10902 |
| **2008** | 1018080 | 106912 | 356790 | 2068 |
| **2009** | 217935 | 226835 | 15736 | 508 |
| **2010** | 533713 | 131168 | 9422 | 140 |
| **2011** | 1514666 | 69507 | 2345 | 1430 |
| **2012** | 558063 | 920684 | 2387 | 277 |
| **2013** | 132646 | - | 16466 | 36 |

*මූලාශ්‍රය : ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය*

**(* 2006 වසර දත්ත ඒකකය පවුල් ලෙස දක්වා ඇත.)**




මූලාශ්‍රය : ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය

**2006 සිට 2013දක්වා ස්වාභාවික ආපදා සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම (රුපියල් මි.)**

| වර්ෂය | ගංවතුර | නියඟය | නායයෑම් | සුළි සුළං |
|---|---|---|---|---|
| 2006 | 143.3 | 15.1 | 4.6 | 10.2 |
| 2007 | 159.1 | 19.9 | 22.5 | 17.6 |
| 2008 | 210.3 | 15.2 | 20.5 | 11.6 |
| 2009 | 202.6 | 31.1 | 4.9 | 43.8 |
| 2010 | 244.0 | 16.3 | 3.25 | 8.6 |
| 2011 | 589.8 | 12.8 | 34.3 | 20.9 |
| 2012 | 113.9 | 58.5 | 0.67 | 3.8 |
| | 118.4 | - | 0.18 | 8.2 |

මූලාශ්‍රය : ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය

ස්වාභාවික ආපදා සඳහා වැඩි ප්‍රමාණයක ප්‍රතිපාදන රු.මි.658 ක් නිදහස් කිරීමක් සිදුවී ඇත්තේ 2011වසරේදීය .දිස්ත්‍රික්ක 23 කට බලපෑම් කල ගං වතුර තර්ජනය මීට ප්‍රධාන හේතුව විය .මේ නිසා ජීවිත හානි 69ක් සිදුවූ අතර පුද්ගලයින් 1514666 කට ගංවතුර තර්ජනයට පමණක් මුහුණ පෑමට සිදුව ඇත.පසුගිය වසර දෙක තුල ස්වාභාවික ආපදා සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන අවම වුයේ කාළගුණික විපර්යාස හේතුවෙන් සිදු වන්නාවූ ස්වාභාවික ආපදා අවම වීමත් සහ අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලද ආපදා අවම කිරීමට අදාල ව්‍යපෘති හා වැඩසටහන් මෙන්ම පෙර සූදානම සහ දැනුවත් භාවය නිසාය.

**සහනාධාර ද්‍රව්‍ය බෙදා හැරීම**

**ආපදා සඳහා ප්‍රධාන සහනාධාර ද්‍රව්‍ය බෙදාහැරීම 2006 සිට 2013 දක්වා**

| ද්‍රව්‍ය | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| මුළුතැන්ගෙයි උපකරණ කට්ටල | 1000 | 1144 | 288 | 6 | 1030 | - | 615 | 1735 | **5818** |
| සෙවිලි තහඩු | - | - | - | - | 280 | 315 | 1318 | 5577 | **7490** |
| විදුලි උත්පාදන යන්ත්‍ර | 4 | - | - | 15 | 55 | 6 | 33 | 51 | **164** |
| ගෑස් සිලින්ඩර් ( කි.ගෑ12)/ලිප් | - | - | 10 | - | - | - | 786 | 36 | **996** |
| විසිරි ජලසම්පාදන පද්ධති | - | - | - | - | 28 | 338 | - | - | **366** |
| වතුර මෝටර | - | - | 15 | - | 22 | 34 | 272 | - | **343** |
| කූඩාරම් | 1791 | 631 | 428 | 106 | 462 | 1337 | 608 | 923 | **6286** |
| භූමිතෙල් ලිප් | | | | | | | | 440 | **440** |

මූලාශ්‍රය : ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය

ආපදා සඳහා ප්‍රධාන සහනාධාර ද්‍රව්‍ය වන මුළුතැන්ගෙයි උපකරණ කට්ටල , සෙවිලි තහඩු , විදුලි උත්පාදන යන්ත්‍ර , කූඩාරම් , ගෑස් ලිප් , /සිලින්ඩර්, සහ භූමිතෙල් ලිප් බෙදා හැරීමේ දී 2013 වසරේ ගම්පහ, පුත්තලම, කොළඹ, හම්බන්තොට, මහනුවර, බදුල්ල, අනුරාධපුර,මඩකලපුව,යාපනය, කිලිනොච්චිය, කුරුණෑගල, මන්නාරම, මාතලේ, මොණරාගල, මුලතිව්, නුවරඑළිය, පොළොන්නරුව,වවුනියාව සහ රත්නපුර යන දිස්ත්‍රික්ක දහනවය ප්‍රතිලාභි දිස්ත්‍රික්ක විය. පසුගිය වසර 4 ක පමණ කාලසීමාව තුළ ප්‍රධාන සහනාධාර ද්‍රව්‍ය බෙදාදීම සම්බන්ධව සලකා බැලීමේ දී මුළුතැන්ගෙයි උපකරණ කට්ටල , සෙවිලි තහඩු සහ අනිකුත් අයිතමයන් වැඩිම ප්‍රමාණයක් බෙදාදීම 2013 වසරේ දී සිදුකර ඇත.

මහජන චීනය, කොරියාව, ජපානය, පකිස්ථානය, ඉතාලිය, රුසියාව සහ සවුදි අරාබිය යන රටවලින් ආපදා සහන භාණ්ඩ සහ උපකරන පරිත්‍යාග ලෙස මෙම අමාත්‍යාංශයට පසුගිය වසර අටක කාලය තුල ලැබුනු අතර ඒවා දිස්ත්‍රික්ක අතර අවශ්‍යතා පදනමින් බෙදා දෙන ලදි. මෙම ද්‍රව්‍යවලට අමතරව ආපදාවලින් විපතටපත් පිරිස සඳහා වියළි ආහාර ද්‍රව්‍ය, පානීය ජලය, ඇඳ ඇතිරිලි, පැදුරු, ජීවිතාරක්ෂක කබා, තුවා, වැඩිහිටි සහ ළමා ඇඳුම්, ප්ලාස්ටික් භාණ්ඩ, පාසල් උපකරණ ආදිය ද ඒ ඒ දිස්ත්‍රික්යන් වෙත ලබාදීමට අවශ්‍යතාවන්ට අනුව ලබාදීමට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය කටයුතු කර ඇත.

**අනිකුත් ක්‍රියාත්මක ව්‍යපෘති / වැඩසටහන්**

**වැසි ජල ටැංකි ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

නියං කාලවලදී පීඩාවට පත්වන ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීම පිණිස ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් ප්‍රතිපාදන ලබාදීම මගින් වර්ෂා කාලයේදී ලැබෙන ජලය රැස්කර තබා ගෙන ජලය හිඟ කාලයේදී භාවිතයට ගැනීම සඳහා වැසිජල ටැංකි ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2006 දී ක්‍රියාත්මක කරන ලදි.

ඒ යටතේ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් 2013 දැයට කිරුළ සංවර්ධන වැඩසටහනට සමගාමීව වැසිජල ටැංකි ඉදිකිරීම පොළොන්නරුව, ත්‍රිකුණාමලය සහ මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කරන ලදී. මෙමගින් එම ප්‍රදේශවල ජනතාවට වැසි ජලය කළමනාකරණය කරගැනීමටත් පිරිසිදු පානීය ජලය ලබාගැනීමටත් හැකියාව ලැබුණි. මෙම තත්ත්වය හේතුවෙන් එම ප්‍රදේශ වල සීඝ්‍රයෙන් පැතිරීගෙන යන වකුගඩු රෝග තත්ත්වය අවම කිරීම සඳහා යම් දායකත්වයක් ලැබී ඇත.





**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉදිකරන ලද වැසිජල ටැංකි ගණන | ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි | ඉදිකිරීම සඳහා වැයකරන ලද මුදල රු.මි | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|
| 1 | වැලිකන්ද | 12 | 0.72 | 0.67 | 100% | 100% |
| 2 | දිඹුලාගල | 12 | 0.72 | 0.71 | 100% | 100% |
| 3 | හිඟුරක්ගොඩ | 12 | 0.72 | 0.71 | 100% | 100% |
| 4 | ඇළහැර | 12 | 0.72 | 0.71 | 100% | 100% |
| | එකතුව | **48** | **2.87** | **2.80** | **100%** | **100%** |

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉදිකරන ලද වැසිජල ටැංකි ගණන | ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි | ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල රු.මි | මූල්‍ය ප්‍රගතිය% | භෞතික ප්‍රගතිය% |
|---|---|---|---|---|---|---|
| 1 | පදවිශ්‍රීපුර | 11 | 0.74 | 0.74 | 100% | 100% |
| 2 | ගෝමරණ්කඩවල | 11 | 0.74 | 0.74 | 100% | 100% |
| 3 | මොරවැව | 11 | 0.74 | 0.74 | 100% | 100% |
| | එකතුව | **33** | **2.23** | **2.23** | 100% | 100% |

මූලාශ්‍රය : ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය

මීට අමතරව මඩකලපුව දිස්ත්‍රික්කයේ ද වැසි ජල ටැංකි 45 ක් ඉදිකරනු ලැබීය. මේ සඳහා රු.මි.3.15 ප්‍රතිපාදන වෙන් වූ අතර, මාන්මුනෙහි/බටහිර වවුනතිව්, නාවක්කඩු, කෝරලෙයිපත්තු උතුර, වාකරෙයි , කෝරලෛයිපත්තු දකුණු, සහ කිරාන් යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මෙමගින් ප්‍රතිලාභ ලබන ලදි. 2013 දී අම්පාර දිස්ත්‍රික්කයේ ද දමන, උහන, ඉරක්කාමම්, පදියතලාව , කිරින්දවෙලි, අම්පාර සහ මහඔය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි පානීය ජල ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් වැසි ජල ටැංකි පවුල් 100 කට පමණ ප්‍රතිලාභ ලැබෙන පරිදි රු.මි.6.72 ක වියදමින් ඉදිකරන ලදි.

පානීය ජල අවශ්‍යතාවය සපුරාලමින් වැසිජල ටැංකි ඉදිකිරීම ආරම්භ කරනු ලැබුවේ 2006 වසරේදීය. 2006-2013 කාලසීමාව තුළ වැසි ජල ටැංකි 300 කට ආසන්න සංඛ්‍යාවක් ඉදිකිරීම සිදුකර ඇත්තේ 2012 වසරතුළයි. මේ සඳහා බදුල්ල, අම්පාර, අනුරාධපුරය,පොළොන්නරුව සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක ප්‍රතිලාභි දිස්ත්‍රික්ක විය.

මේ හේතුවෙන් නියගයෙන් පීඩාවිදි රිදීමාලියද්ද, කන්දකැටිය, මීගහකිවුල , ඌවපරණගම, දමන, උහන, අම්පාර, මහඔය , තිරප්පනේ, රඹෑව , මිහින්තලේ, දිඹුලාගල, වාකරේ වැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ජීවත්වන ජනතාවගේ පානීය ජල පහසුකම් සපුරාලීමට හැකියාව ලැබී ඇත.

**වගාළිං ඉදිකිරීම - 2013**

**මන්නාරම් දිස්ත්‍රික්කය**

| අනු අංකය | මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ඉදිකරන වගාළිං ගණන | ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි | ඉදිකිරීම සඳහා භාවිතා කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි | මූල්‍ය ප්‍රගතිය% | භෞතික ප්‍රගතිය% |
|---|---|---|---|---|---|---|
| 1 | මාන්තායි - බටහිර | 32 | 3.24 | 3.24 | 100% | 100% |

**ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් ලබාදුන් ආධාර යටතේ ඉදිකර තිබූ වගා ළිං**





මෙම ළිං පානීය ජල අවශ්‍යතාවයට මෙන් ම කෘෂි කාර්මික කටයුතු වලට ද දෛනික අවශ්‍යතාවයන්ට ද යොදා ගෙන ඇති බැවින් එය අවතැන් වූ ජනතාවගේ සමාජ හා ආර්ථික මට්ටම ඉහල නැංවීමට මහෝපකාරී වී ඇත.

ඉදිකරන ලද වගා ළිං භාවිතයෙන් වගාකටයුතු සිදුකරන ලද ආකාරය





වගාලිං ඉදිකිරීම මඟින් මන්නාරම දිස්ත්‍රික්කය ශුෂ්ක කළාපීයව පිහිටා තිබීම තුළ ප්‍රජාවගේ ජල අවශ්‍යතාවය සපුරාගැනීමට හැකි වී ඇත.



ඒ අනුව මන්නාරම් ජනාතාවගේ කෘෂි කාර්මික කටයුතු ඉහල නැංවීමට හැකියාව ලැබී ඇත. එමගින් ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් වී ඇති අතර, ඔවුනගේ දෛනික පෝෂණ අවශ්‍යතාවයද සම්පූර්ණ කර ගැනීමට හැකි වී ඇත. වත්මන් රජය විසින් සිදුකරනු ලබන දිවිනැගුම වැඩසටහන සාර්ථක කරගැනීම සඳහාද මෙම ව්‍යාපෘතිය මහෝපකාරී වී ඇත.

ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් වීම තුළින් ඒකපුද්ගල ආදායම් මට්ටම ඉහළනැංවීමට හැකියාව ලැබෙනු ඇත. වර්තමාන රජයේ ඉලක්කයක් වන ගෙවතු වගා සංවර්ධනය තුළින් ජනතාවගේ ආහාර අවශ්‍යතාවය ගෙවත්ත තුළින්ම සපුරා ගැනීම සඳහාත් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය ග්‍රාමීය ජනතාවගේ දායකත්වය පූර්ණ වශයෙන් ලබාගැනීම සඳහාත් මෙම වැඩසටහන මගින් හැකියාව ලැබී ඇත.

- ✓ **තොරතුරු සන්නිවේදන ක්‍රියාවලිය**

**අන්තර්ජාල තොරතුරු පද්ධතිය මගින් ආපදා සිදු වී කෙටි කාලයක් තුළ තොරතුරු ලබා ගැනීම**

**''සහන'' ආපදා කළමනාකරණ පද්ධතිය.**

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන නියෝජිත ආයතනයේ අනුග්‍රහය ඇතිව රාජ්‍ය අංශය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය මගින් **'සහන'** ආපදා කළමනාකරණ පද්ධතිය සමග ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සහ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ජාලගත කිරීම සිදු කෙරෙමින් පවතියි. මෙම ජාලයේ අරමුණ වන්නේ හදිසි ආපදා වාතාවරණයන්හිදී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ආපදා තොරතුරු ලබා ගැනීම සඳහා සඵලදායී සන්නිවේදන පද්ධතියක් ඇති කර ගැනීමයි. සහන හා පුනරුත්ථාපන වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නිරීක්ෂණය කිරීම පිණිස මෙම තොරතුරු භාවිතා කළ හැකි ය. මෙම පද්ධතිය දිවයින පුරා සාර්ථක ලෙස ක්‍රියාත්මක කරනු පිණිස පරිපාලන දිස්ත්‍රික්ක 25 තුළ දිස්ත්‍රික් සංවර්ධන නිලධාරීන් 25 දෙනකු හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වා ඇත. මේ වන විට එය ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත කිරීම් කටයුතු සිදුකරමින් පවතී.

ඒ අනුව ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් පුත්තලම, මොණරාගල, නුවරඑළිය, මඩකළපුව, කිලිනොච්චිය, වවුනියාව, මුලතිව්, මන්නාරම, මාතලේ, පොළොන්නරුව, ගාල්ල, කළුතර, ගම්පහ, කොළඹ, අනුරාධපුර, අම්පාර, යාපනය, මාතර, රත්නපුර, කෑගල්ල යන දිස්ත්‍රික්කයන්හි සේවයේ නියතු සියලුම සංවර්ධන සහකාර(ආපදා කළමනාකරණ) නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්(ආපදා සහන සේවා) සඳහා ආපදා සහන සේවා ලබා දීම, සහන මෘදුකාංගය හරහා තොරතුරු වාර්තා කළ යුතු ආකරය සහ ආකෘති පත්‍ර අනුව වාර්තා කිරීම පිළිබඳ පුහුණු කිරීම සිදු කර ඇති අතර සියලුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් සඳහා මේ පිළිබඳ එක්දින පුහුණු වැඩසටහනක් ද පවත්වන ලදී.

එක්දින පුහුණු වැඩමුළුව





**ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

පශ්චාත් ආපදා තත්ත්වයකදී ඒ සඳහා සාර්ථකව මුහුණදීම සඳහා ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් මට්ටමින් සිදු කරන ලදි. එමගින් ග්‍රාමීය ජනතාව ආපදා අවස්ථාවකදී ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීම සිදුකෙරෙයි.

ක්‍රියාත්මක කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් 2013

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අම්පාර | 4 |
| 2 | අනුරාධපුර | 4 |
| 3 | ගාල්ල | 5 |
| 4 | යාපනය | 10 |
| 5 | කෑගල්ල | 2 |
| 6 | රත්නපුර | 4 |
| 7 | පුත්තලම | 1 |
| 8 | මාතර | 4 |
| 9 | නුවරඑළිය | 1 |
| **එකතුව** | | 35 |



පශ්චාත් ආපදා කළමනාකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම තුලින් ආපදාවකදී ඔවුන්ගේ ජීවිත හා දේපල වලට සිදුවන හානිය අවමකර ගනිමින් මානසික වශයෙන් ශක්තිමත් ලෙස ආපදාවන්ට මුහුණ දීමේ හැකියාව වර්ධනය වන අතර කෙටි කාලයක් තුලදී ඔවුන් ආර්ථික, සාමාජීය හා පාරිසරික වශයෙන් යථාතත්ත්වයට පත්වීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කර ගැනීමට හැකිවී ඇත.

මෙහිදී විශේෂයෙන් පාසල් ළමුන් දැනුවත් කිරීම තුලින් අනාගත පරපුර සඳහා ආපදා කළමනාකරණය පිළිබඳ දැනුම ලබාදීම ද ඔවුන් ආපදාවන්ට මුහුණදීම සඳහා කායික හා මානසික වශයෙන් සූදානම් කිරීම ද සිදුවේ. එමෙන්ම ඔවුන්  සමාජය තුල පසු ආපදා කළමනාකරණය පිළිබඳව පණිවඩය ගෙනයන සන්නිවේදකයින් වශයෙන් ද ක්‍රියා කරනු ඇත. පසු ආපදා තත්ත්වයකදී වඩාත් සුරක්ෂිතව හා මානසික වශයෙන් පීඩාවට පත් නොවන පරිදි රැකගතයුතු විශේෂ පුද්ගල කොටසක් ලෙස කුඩා ළමුන් සැලකිය හැකිය. ඒ අනුව ආපදා පිළිබඳව පාසල් ළමුන්ගේ දැනුම ඉතා වැදගත් වනු ඇත. එමගින් ඔවුන් පසු ආපදාවන් සඳහා වඩාත් හොඳින් මුහුණදීමට හා පසු කම්පනයන්ට ගොදුරුවීම අවම කරගත හැකි වනු අත.





**අභියෝග**

- ✓ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් සඳහා බඳවා ගන්නා ලද නිලධාරීන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.
- ✓ ආපදා සහන සේවා කටයුතු විවිධ ආයතන වෙත යොමු වී නිසා ආයතන එකම කාර්යය සිදු කිරීම

**ඉදිරි සැලසුම් (2014)**

- ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සඳහා 2014 වර්ෂය වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන යොදා ගනිමින් ස්වභාවික ආපදාවන්ගෙන් විපතට පත්වන ජනතාවට ජාතික අයවැය චක්‍රලේඛ අංක 152 (I) ට අනුව කඩිනම් සහන සැලසීම හානියට පත්වන නිවාස ප්‍රතිසංස්කරණය හා බිඳ වැටුන ජීවනෝපාය මාර්ග නගා සිටුවීම සඳහා සහනාධාර ලබාදීම.

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි සහන සේවා කටයුතු සිදුකිරීම සඳහා බඳවා ගන්නා ලද නවක උපාධිධාරීන් සඳහා ආපදා කළමනාකරණ ක්‍රියාවලීන් පිළිබඳව මෙන්ම සහන සේවා කටයුතු කාර්යක්ෂමව හා විධිමත්ව ඉටු කිරීම පිළිබඳව මූලික දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළු නොපවත්වන ලද  දිස්ත්‍රික්ක සඳහා පැවැත්වීම.

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා අනුයුක්ත කර ඇති ආපදා සහන සේවා නිලධාරීන් මඟින් ග්‍රාමීය ආපදා සහන සේවා කමිටු පිහිටුවීම හා පසු ආපදා තත්තවයන් සඳහා සාර්ථකව මුහුණදීම පිළිබඳව ග්‍රාමීය ප්‍රජාව හා පාසල් ළමුන් දැනුවත් කිරීම හා ඒ පිළිබඳව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- පසු ආපදා තත්ත්වයකදී සහන සේවා කටයුතු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිවැරදි දත්ත හා තොරතුරු ආපදාව සිදු වී කෙටි කාලයක් තුල වාර්තා කිරීම සඳහා ස්ථාපිත සහන මෘදුකාංගය දිවයින පුරා ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් දිස්ත්‍රික්ක මට්ටමින් ස්ථාපිත කිරීම.

- නියඟය හේතුවෙන් පානීය ජලය සපයා ගත නොහැකිව පීඩාවිදින ජනතාවට එම පීඩාව අවම කර ගැනීම සඳහා වැසි ජල ටැංකි ඉදිකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

- ආපදා සහන ලබාදීමේ දී නියමිත ප්‍රතිලාභියා වෙතම සහනාධාර ලැබෙන්නේ ද යන්න සහතික කර ගැනීම සඳහා GPS හා GIS තාක්‍ෂණය යොදා ගනිමින් නිවාස සහනාධාර ලබාදුන් ප්‍රතිලාභීන් පිළිබඳව සිතියම් ගත කිරීම තුලින් අධීක්‍ෂණ හා ඇගයීම් කටයුතු වඩාත් විධිමත් හා විනිවිධ භාවයකින් සිදුකිරීම.

බාධක

- ආපදා සහනසේවා කටයුතු විවිධ ආයතන වෙත යොමු වී තිබීම නිසා එකම කාර්යය ආයතන කිහිපයකින් සිදුකිරීම
- අළුතින් බඳවාගත් සංවර්ධන නිළධාරීන් පුහුණු කිරීම
- ඔවුන් සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

**බාධක අවමකර ගැනීමේ උපායයන්**

- ආපදා සහන කටයුතු එක ආයතනයක් යටතට පත්කිරිම
- ආපදා සහන කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාකාරීව දායක වන ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රියාකාරී යාන්ත්‍රණයක් ඇති කිරීම
- මූල්‍යාධාර ලබාදීමෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම හා යටිතල පහසුකම් ලබාදීම